

සන්න සහිත

# අභිසම්බෝධි අලංකාරය

සන්න සහිත

# අභිසම්බොධි අලඞ්කාරය.

ශ්‍රී සෙඛණ්ඩශෛලාභිධාන පුරප්‍රවරයෙහි විසූ

**මහා ස්ථවිරතුමෙකු විසින්**

වි ර චි ත යි.

**සමර්ථ ස්වාමින්වහන්සේ නමක් ලවා**

ශු ද්ධ ක ර වා ගෙ ණ

**පී. ඇ ස්. ජේ්‍ර ශ ව න මා වි සි ණ්**

විද්‍යාසාගර යන්ත්‍රාලයෙහි

මුද්‍රනයකරවනලදී.

**ශ්‍රී. බු. ව. 2441.**

1897.

# දැන්වීමයි.

**"අභිසම්බෝධි අලංකාර"** නම් මෙම ග්‍රන්ථය අප මහබෝසතාණන්ගේ නියතවිවරණශ්‍රී ආදිය පිළිබඳව දීපඞ්කර පාදමූලයෙහි පටන් සම්‍යක්සම්බෝධිය දක්වා සංක්‍ෂෙප බෝධිසත්ව චරිතය කථා ශරීරකොට කරණලද්දකි–මෙහි කතෘ කවරකලක කොතැන්හි විසූ කෙනෙක්දැයි පොතේ නොපෙණෙන නිසා නිශ්චයකොට කියනොහැකියි. නමුත් මීට අවුරුදු (100) සියයකට පමණ පූර්වයෙහි සෙංකඩගලනුවර විසූ සත්විරතුමෙකු විසින් කරණලද්දේයයි සමහරු කියති. ඒගැණ මුඛපරම්පරා කථාමාත්‍රය මුත් ඊට වඩා කියයුතු සාක්‍ෂියක් නොපෙණේ. එසේදඋවත් ඒ කථාමාත්‍රය ඇසුරුකොට ටයිටලය ලිව්මි. කතෘ කවුරු නමුත් ග්‍රන්ථය මධුර කොමලවෘතයන්ගෙන් සමලඞ්කෘතකොට කණ්රසායන පරිද්දෙන් ලිහිල්භාෂායෙන් කරතිබේ– සන්නයද ගාථාවල අදහස් පහසුවෙන් තේරුම් යන ලෙස ඉතා ලිහිල් පරිද්දෙන් කරතිබීම භාවිතාකරන්නන්ට ඉතාමත් පහසුවකි.

මෙය මුද්‍රණයකරවීමේදී උඩ පහත දෙරටින් පොත් කීපයක් සපයා සංසන්දනයකොට බැළූ නමුත් එකකට එකක් වෙනස්ව සමහරතැන් කියවාගැණීමට පවා දුෂ්කරලෙස කාලාන්තර දොෂයන්ගෙන් ගහණව තුබුනේය.

තවද මෙහි කීපපලක්ම අප අදහසට එකඟනොවනසේ දක්නාලද්දේ නමුත් වැඩිගණනක් පොත්වල තිබුන ලෙසටම යෙදීමු.

මෙය නැවත මුද්‍රණයකරණ කාලයකදී තවදුරටත් ශොධනයකරවාගෙණ මුද්‍රණයකරණ බවත් නැවත මුද්‍රණයකුරවීමේ බලය මටම තබාගත් බවත් දන්වමි.

මෙවගට,

20/11/97. **P. S. PERERA.**

# අභිසම්බොධි අලඞ්කාරය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1. බුද්ධං සුද්ධගුණාකරං දසබලං දෙවාතිදෙවං ජිනං
ධම්මං තෙන සුදෙසිතං භවනුදං දුක්ඛාපහං නිම්මලං,
සඞ්ඝඤ්චාපි නිරඞ්ගණං මුනිසුතං වන්දාමහං මුද්ධනා
බුද්ධො ධම්මගණො තථාගතවරො පාලෙන්තු තෙ මං සදා.

2. නත්වා වත්ථුත්තයං එවං සුලද්ධො අභයම්පි ච
යථා වජිරාලයං පත්තො රතනත්තය පාලිනො,
කරිස්සං **අභිසම්බොධි අලඞ්කාරං** මනොරමං.

---

1. **සුද්ධගුණාකරං**, අභින් සම්‍යක් සම්බොධාදී පිරිසිදු ගුණයන්ට උත්පත්තිස්ථානවූ; දසබලං, දශබලධාරීවූ; දෙවාතිදෙවං, දෙවාතිදෙවවූ; ජිනං, පස්මරුන් දිනූවාවූ; බුද්ධං, (පරොපදෙශ රහිතව කාලත්‍රයවර්ත්තිවූ සර්වධර්මයන් සර්වාකාරයෙන් දත්තාවූ) සර්වඥයන්වහන්සේද; තෙන සුදෙසිතං, ඒ සර්වඥයන්වහන්සේ විසින් මනාකොට දේශනාකරණලද්දාවූ; භවනුදං, භවොත්පත්තිනසන්නාවූ; දුක්ඛාපහං, එහෙයින්ම ජාත්‍යාදි සියලු දුක් දුරුකරන්නාවූ; නිම්මලං, රාගාදි මලාපගම වශයෙන් නිර්මලවූ; ධම්මං, සපර්‍යාප්තික නවලොකොත්තර ශ්‍රීසද්ධර්මයද; මුනිසුතං, සර්වඥ පුත්‍රවූ; නිරඞ්ගණං, ක්ලේශාඞ්ගණ රහිතවූ; සඞ්ඝඤ්චාපි, අෂ්ටාර්‍ය්‍යපුද්ගල මහාසඞ්ඝයාද; අහං, මම; මුද්ධනා, උත්තමාඞ්ගය කරණකොටගෙණ; වන්දාමි, භක්තිප්‍රේමයෙන්වදිමි; තථාගතවරෙ, උත්තම තථාගතවූ; බුද්ධො, සර්වඥයන්වහන්සේද; ධම්ම ගණො, ධර්මයද සඞ්ඝයාද යන; තෙ, ඒ උත්තමවරයෝ; මං, (සර්වොපද්‍රව නිවාරණය පිණිස නමස්කාරකොට සිටින්නාවූ;) මා; සදා, යුගසංවත්සර මාසාර්ධමාසරාත්‍රි දිවා පූර්වාහ්ණාපරාහ්ණාදි සර්වකාලයෙහිම; පාලෙන්තු, (ආයුරාරොග්‍යාදි සකලාභිවෘද්ධි වර්ධනයකොට) රක්ෂාකෙරෙත්වා.

2. එවං, මේ යථොක්තප්‍රකාරයෙන්; වත්ථුත්තයං, බුද්ධාදි රත්නත්‍රයට; නත්වා, වැඳ; අභයම්පිච, (සර්වොපද්‍රව නිවාරණ වශයෙන්) අභයද; සුලද්ධො, මනාකොට ලද්දාවූ; වජිරාලයං, විදුරුගෙයකට; පත්තො, පැමිණියෙක්; යථා, යම්සේද එමෙන්; රතනත්තය පාලිනො, බුද්ධාදි රත්නත්‍රය රක්ෂාකරන්නාවූ මම; මනොරමං, මනොරම්‍යවූ; අභිසම්බොධි අලඞ්කාරං, අභිසම්බොධි අලඞ්කාරනම් ප්‍රකරණයක්; කරිස්සං, කරන්නෙමි; හෙවත් කථනය කෙරෙමි.

3. සහස්සකප්පාන සතාව උත්තරෙ
අසඞ්ඛසඞ්ඛානචතුන්නමත්ථකෙ,
නිරන්තරෙ උත්තම ජම්බුදීපකෙ
පුරං අහූ යං අමරාභිධානකං.

4. තහිං දයා සීතලමානසො ච යො
ගුණුත්තමො පඤ්ඤවරඞ්ගණාලයො,
අසෙසවෙදණ්ණව පාරතීරගො
විසාරදෙ සිප්පවිසෙස ඤාතකො.

5. අනඞ්ගරූපො වර විප්පඅන්වයො
අහූ සුමෙධො ඉති පණ්ඩිතො සුධී,
මහද්ධනො මාතුපිතුන්නමච්චයෙ
ඝරෙ ඨිතො සො සකමෙව බුද්ධියා.

---

3. සහස්සකප්පානසතාව උත්තරෙ, සහශ්‍රප්‍රමිතකල්පයන් සම්බන්ධවූ සියයක් අධිකකොට ඇති; අසඞ්ඛසඞ්ඛාන චතුන්නමත්ථකෙ, අසඞ්ඛ්‍ය ප්‍රමිත සඞ්ඛ්‍යාවන් සම්බන්ධවූ සතරක් හුගේ මතුයෙහි; හෙවත් සාර සඞ්ඛ්‍ය කල්පලක්‍ෂයකින් මත්තෙහි; නිරන්තරෙ, නිරන්තරවූ; උත්තම ජම්බුදීපකෙ, උතුම්වූ ජම්බුද්වීපයෙහි; අමරාභිධානකං, අමරනාමධෙය යක් ඇති; යං පුරං අහු, යම් පුරප්‍රවරයක්විද.

4. තහිං, එපුරයෙහි; යො, යම් මහබෝසතානකෙනෙක්, දයා, කරුණාවෙන්; සීතලමානසො, සිහිල්වූ චිත්තසන්තාන ඇති; ගුණුත්තමො, උතුම්වූ ගුණ ඇති; පඤ්ඤාවරඞ්ගණ, උතුම්වූ ප්‍රඥා නමැති අඞ්ගණාවට; ආලයො, ගෘහයක් බඳුවූ; අසෙසවෙදණ්ණව, සියලු වේද නමැති සාගරයාගේ; පාරතීරගො, පරතෙරට පැමිණියාවූ; විසාරදෙ, විසාරදවූ; සිප්ප විසෙසඤ්ඤාතකො, සියලු ශිල්ප විශෙෂයන් දත්තාවූ,

5. අනඞ්ගරූපො, මකරධ්වජසන්නිභවූ රූ ඇති; වරවිප්පඅන්වයො, උතුම් බ්‍රාහ්මණවංශ ඇති; සුධී, නුවණැත්තාවූ; සුමෙධො අහු ඉති පණ්ඩිතො, සුමෙධපණ්ඩිතය යන නමින් ප්‍රසිද්ධව උපන්නේද; (එයේ ඉපද) මහද්ධනො, මහධන ඇති; මාතුපිතුන්නං අච්චයෙ, මව් පිය දෙදෙනාගේ ඇවෑමෙන්; ඝරෙ ඨිතො, ගිහිගෙයි සිටියාවූ; සො, ඒ සුමෙධපණ්ඩිතතෙම; සකමෙව බුද්ධියා, තමන්ගේ සවබුද්ධියෙන්ම.

6. භවෙ ච භොගෙ ච සකෙ ච ජීවිතෙ
විලොකයිත්වාන අසාරභාවකං,
පදානතො වත්ථු ගහෙත්වා සාරකං
රුදං මුඛං ඤාතිගණං පහාය තං.

7. අනන්තසංචාර මිගින්දකාදිනං
නිකූජිතං පක්ඛිමයූරකාදිනං,
සුමණ්ඩිතං චන්දනකානනාදිනං
නිසෙවිතං තාපසපුඞ්ගවාදිනං.

8. හිමාචලං තං සමුපෙච්ච උත්තමං
පහාය වෙසං අඛිලං ඝරාරහං,
ඉසීන පබ්බජ්ජවසා තදා හි තු
ගවෙසමානො අමතං සුපබ්බජි.

9. එවං ච සො පබ්බජිතො සමානො
කත්තබ්බකිච්චෙව චභිවායමානො,
සහෙවභිඤ්ඤං වර ඣානලාභී
වසං වසී තෙන සුඛෙන තස්මිං.

---

6. භවෙ ච, භවයෙහිද; භොගෙ ච, භෝගයෙහිද; සකෙ ච ජීවිතෙ, ස්වකීය ජීවිතයෙහිද; අසාරභාවකං, නිස්සාරභාවය; විලොකයිත්වාන, බලා; පදානතො, ප්‍රදානය කිරීමෙන්; වත්ථුසාරකං, වස්තුසාරය; ගහෙත්වා, ගෙණ; රුදං මුඛං, අඬන්නාවූ මුහුණු ඇති; තං ඤාතිගණං පහාය, ඒ ඤාතිගණයා හැර.

7. මිගින්දකාදිනං, මෘගේන්ද්‍රසඞ්ඛ්‍යාත සිංහාදීන්ගේ; අනන්තසංචාර, අප්‍රමාණවූ සංචාර ඇති; පක්ඛිමයූරකාදීනං, මයූරාදී පක්ෂීන් විසින්; නිකූජිතං, පවත්වන හඬ ඇති; චන්දනකානනාදීනං, සඳුන් වනාදීන්ගේ; සුමණ්ඩිතං, මනා සැරසීම් ඇති; තාපස පුඞ්ගවාදීනං, උත්තම තාපසයන් වහන්සේලා විසින්; නිසෙවිතං, මනාකොට සෙවිනාලද්දාවූ.

8. තං උත්තමං හිමාචලං, ඒ උතුම් හිමවත් පර්වතයට; සමුපෙච්ච, එළඹ; ඝරාරහං, ගෘහවාසී ජනයාට සුදුසුවූ; අඛිලං වෙසං, සියලු වේශය; පහාය, හැර; තදා හි තු, එසමයෙහිවනාහි; ඉසීනං පබ්බජ්ජවසා, ඍෂිවරයන්ගේ ප්‍රව්‍රජ්‍යාවශයෙන්; අමතං, අමෘතසඞ්ඛ්‍යාත නිර්වාණය; ගවෙසමානො, ගවේෂණය කරමින්; සුපබ්බජි, මනාව පැවිදිවූසේක.

9. එවං, මෙසේ; පබ්බජිතො සමානො, පැවිදිවූයේද; කත්තබ්බකිච්චෙව ච; කටයුතු කෘත්‍යයෙහිද; අභිවායමානො, විසෙසින් උත්සාහ කරණුයේය; සහෙවභිඤ්ඤං, අභිඥාව හා සමග; වරඣානලාභී, උතුම්වූ ධ්‍යාන ලාභීවූ; සො, ඒ තාපසතෙම; තෙන සුඛෙන, ඒ ධ්‍යානසුවයෙන්; තස්මිං, ඒ හිමවත් පෙදෙසෙහි; වසං වසී, විසීමකළේය.

10. ලොකත්තයෙ මොහතමප්පබන්ධං
හන්ත්වා ධරන්තං වර ධම්මදීපං,
දීපඞ්කරං ලොකගුරුං මහන්තං
සමුපගන්ත්වාන ජිනං මහෙසිං.

11. දිස්වා තං ලොකනාථං සුරනරමහිතං බුද්ධරංසුජ්ජලන්තං
පූජෙත්වා අත්තභාවං දසබලමුනිනො ජීවිතංචාපි තෙන,
සිද්ධෙසොයංජිනින්දො භවති ඉති තදා ව්‍යාකතො ධම්මරඤ්ඤා
තං සුත්වා බොධිසත්තො පරහිත නිරතො පීතියා පුණ්ණකායො.

12. යෙ බොධිපාචනකරා ඉධ බුද්ධධම්මා
කාලත්තයෙ මුනිවරෙහි පි සෙවමානා,
දානාදිනා දසවිධා සමතිංසකාච
තෙ බුද්ධධම්මනිඛිලෙ සමදික්ඛිත්වා.

---

10. ලොකත්තයෙ, භුවනත්‍රයෙහි; මොහතමප්පබන්ධං, මොහාන්ධකාර ප්‍රබන්ධය; හන්ත්වා, නසා; ධරන්තං, ධරන්නාවූ; වරධම්මදීපං, උතුම්වූ බම්ප්‍රදීප ඇති; ලොකගුරුං, ලෝකාචාර්‍ය්‍යවූ; මහන්තං, පූජාවෙන් මහත් වූ; ජිනං, පස්මරුන් දිනූවාවූ; මහෙසිං, මහාඍෂිවූ; දීපඞ්කරං, දිපඞ්කුරු බුදුන්කරා; සමුපගන්ත්වාන, මොණවට එළඹ.

11. ලොකනාථං, ලෝකනාථවූ; සුරනරමහිතං, දෙව්මිනිසුන් විසින් පුදනුලබන්නාවූ: බුද්ධරංසුජ්ජලන්තං, බුදුරැස්මින් දිලිසෙන්නාවූ; තං, ඒ සර්වඥයන්වහන්සේ; දිස්වා, දැක; දසබලමුනිනො, දශබලධාරීවූ ඒ බුදුන්ට; අත්තභාවං, ආත්මභාවයද; ජීවිතංච අපි, ජීවිතයද; පූජෙත්වා, පුදා; තෙන ධම්මරඤ්ඤා, ඒ ධර්මරජයා විසින්; අයං, මේතෙම; සිද්ධෙසො ජිනින්දො භවති ඉති, සිද්ධාර්ථ නම් ජිනෙන්ද්‍රයෙක් වන්නේයයි; තදා, එකල්හි; ව්‍යාකතො, ප්‍රකාශකරණලද්දේය; * පරහිතනිරතො, පරවැඩෙහි ඇළුනාවූ; බොධිසත්තො, මහාබොධිසත්වතෙම; තං සුත්වා, ඒ වචනය අසා; පීතියා, ප්‍රීතියෙන්; පුණ්ණකායො, පරිපූර්ණ ශරීර ඇත්තේ.

12. ඉධ, මේ ලෝකයෙහි; බොධිපාචනකර, බොධිය මුහුකරවන්නා වූ; යෙ බුද්ධධම්මා, යම් බුද්ධකාරකධර්මකෙනෙක්; කාලත්තයෙ මුනිවරෙහි පි, කාලත්‍රයෙහි මුනිවරයන් විසිනුදු; සෙවමානා, සෙවුනා ලබන්නාවූද; දානාදිනා, දානාදීවූ; දසවිධා, දශවිධවූ; සමතිංසකාච, (දසපාරමිය දසඋපපාරමිය දසපරමාර්ථපාරමිය යන ප්‍රභෙද හෙයින්) සමතිසක්වූ; තෙ බුද්ධධම්මනිඛිලෙ, ඒ සියලු බුද්ධකාරකධර්මයන්; සමදික්ඛිත්වා, මනාව අධිෂ්ඨාන කොට.

---

* ව්‍යාකරණ දෙන ලද්දේය—ඇතැම්

13. **කොණ්ඩඤ්ඤ**ම්පි ච නායකං දසබලං කාරුඤ්ඤකං **මඞ්ගලං**
ලොකග්ගං **සුමන**ව්හයං පිරගුණං මොක්ඛාකරං **රෙවතං**,
රූපග්ගම්පි ච **සොභිතං** වර **මනොදස්සි** ච දීඝඞ්ගුලිං
ධම්මග්ගං **පදුමං** ජිනං අමතදං පූජාරහං **නාරදං**.

14. සච්චාරං **පදුමුත්තර**ම්පි ච **සුමෙධං** නාම **මෙධඞ්කරං**
ජාතිධංසි**සුජාත**මග්ගමතදං බ්‍රහ්මුජ්ජුගත්තම්පි ච,
සම්බුද්ධං **පියදස්සි** නාම සිවදං තං **අත්ථදස්සි** වරං
වීරග්ගම්පි ච **ධම්මදස්සි** සුගතං **සිද්ධත්ථ** ලොකුත්තමං.

15. **තිස්ස**ඤ්චාපි නිරුත්තරං නරවරං **ඵුස්සං** විසුද්ධාකරං
ලොකානන්දකරං **විපස්සි**මතුලං වීරං **සිඛී** මාරජිං,
නාථං **වෙස්සභූ** ධම්මරාජ **කකුසන්ධ**ඤ්චා පි අඞ්ගීරසං.
තං **කොනාගමණං** මුනිං ගුණනිධිං බුද්ධඤ්ච තං **කස්සපං**

---

13. දසබලං, දශබලධාරීවූ; කොණ්ඩඤ්ඤම්පි ච නායකං, කොණ්ඩඤ්ඤ නම් බුදුන්ද; කාරුඤ්ඤකං, කරුණාඇත්තාවූ; මඞ්ගලං, මඞ්ගලනම් බුදුන්ද; පිරගුණං, සපිරගුණ ඇති; ලොකග්ගං, ලෝකාග්‍රවූ; සුමනව්හයං, සුමණ නම් බුදුන්ද; මොක්ඛාකරං, මෝක්‍ෂකරවූ; රෙවතං, රෙවතනාම් බුදුන්ද; රූපග්ගං, රූපාග්‍රවූ; සොභිතම්පි ච, සොභිත නම් බුදුන්ද; වරං, උතුම්වූ; දීඝඞ්ගුලිං, දීඝී ඇඟිලි ඇත්නාවූ; අනොමදස්සිංච, අනෝම දර්ශිනම් බුදුන්ද; ධම්මග්ගං, ධර්මාග්‍රවූ; පදුමං ජිනං, පදුමනාම් බුදුන්ද; අමතදං, අමෘතදායකවූ; පූජාරහං, පූජාර්හවූ; නාරදං, නාරදම් බුදුන්ද.

14. පදුමුත්තරං, පදුමුත්තරාභිධානවූ; සච්චාරම්පි ච, ශාස්තෲහුද; සුමෙධංනාම, සුමෙධාභිධාන බුදුන්ද; මෙධඞ්කරං, මෙධඞ්කරනම් බුදුන්ද; ජාතිධංසි, ජාතිය විධ්වංශනායකලාවූ; අග්ගං, අග්‍රවූ; අමතදං, අමෘතදායකවූ; සුජාතං,සුජාතාභිධානනම් බුදුන්ද; බ්‍රහ්මුජ්ජුගත්තම්පි ච, බඹ ඉදි ගාත්‍ර ඇත්තාවූද; සම්බුද්ධං, සම්‍යක්සම්බුද්ධවූ; පියදස්සිනාම සිවදං, ප්‍රියදර්ශිනම් සිවදායකද; වරං, උතුම්වූ; තං අත්ථදස්සිං, ඒ අර්ථදර්ශි සර්වඥද; වීරග්ගං, වීර්‍ය්‍යාග්‍රවූ; ධම්මදස්සී සුගතම්පි ච, ධර්මදර්ශී සුගත්හුද; සිද්ධත්ථලොකුත්තමං, ලොකොත්තමවූ සිද්ධාර්ථනම් සර්වඥයන්ද.

15. නිරුත්තරං, නිරුත්තරවූ; නරවරං, නරොත්තමවූ; තිස්සංචාපි ච තිස්සනම් බුදුන්ද; විසුද්ධාකරං, නිර්වාණයට ආකරවූ; ඵුස්සං, ඵුස්ස නම් බුදුන්ද; ලොකානන්දකරං, ලොකානන්දකරවූ; අතුලං, අතුල්‍යවූ; විපස්සිං, විපස්සීනම් බුදුන්ද; වීරං, මහාවීරවූ; මාරජිං, පස්මරුන් ජය ගත්තාවූ; සිඛී, සිඛිනම් බුදුන්ද; ධම්මරාජං, ධර්මරාජත්වූ; වෙස්සභූනාථං, වෙස්සභූනම් බුදුන්ද; අඞ්ගිරසං, ඇඟින් රැස්විහිදෙන්නාවූ; කකුසන්ධඤ්චාපි, කකුසඳ නම් බුදුන්ද; ගුණනිධිං, අභිධ්‍යාදී ගුණයට නිධානවූ; කොනාගමණංමුනිං, කොනාගම නම් සර්වඥයන්වහන්සේද; කස්සපං, කාශ්‍යපාභිධාන ඇති; තං බුද්ධංච, ඒ සියල්ල දත්තාවූ බුදුන්ද.

16. දිස්වා පූජෙත්වා එතෙ පි ච මුනිසකලෙ ව්‍යාකතො තෙහි චාපි
පූරෙන්තො බොධිසත්තො අසිථිලවිරියො බොධිසම්භාර ධම්මෙ;
රාජාහුත්වා ච වෙස්සන්තර අවනිපතී දානතෙජෙන භූමිං
කම්පෙත්වා සත්තවාරෙ තුසිතපුරවරෙ සො අහූ දෙවරාජා.

17. මහාබ්‍රහ්මසක්කාදයො දෙවරාජා
සමාගන්ත්වා බුද්ධඞ්කුරං තං නමිත්වා
මහාවීර කාලො අයං බුද්ධභාවං
තුවං චාපි ගන්ත්වා මනුස්සානලොකං.

18. ජනිත්වාන තස්මිං වරං මාතුකුච්ඡිං
ජනං තාරයන්තො සදෙවං තිලොකෙ,
සුඛං බුජ්ඣ ධම්මනති වත්වාන එවං
සමාරාධිතො දෙවලොකා චවිත්වා.

---

16. එතෙ පිච මුනි සකලෙ, (කොණ්ඩඤ්ඤාදී කසුප්බුදුන් කෙළවර කොටඇති) මේ සියලු සර්වඥවරයන්ද; දිස්වා, දැක; පූජෙත්වා, (බුද්ධවංශාදී යෙහි ආ ක්‍රමයෙන්)වැඳපුදා; තෙහි ච අපි, ඒ සර්වඥයන් විසිනුදු; ව්‍යාකතො, විවරණ දෙනුලැබුවාවූ; බොධිසත්තො, බොධිසත්ත්වතෙම; අසිථිලවිරියො, ලිහිල්නොවූ වීර්‍ය්‍ය ඇත්තේ; බොධිසම්භාරධම්මෙ, බොධිසම්භාර ධර්‍මයන්; පූරෙන්තො, පුරණයේක්; අවනිපතී, පෘථ්වීස්වරවූ; වෙස්සන්තර රාජාහුත්වාච, වෙස්සන්තරනම් රජව ඉපිදද; දානතෙජෙන, දානතේජස් බලයෙන්; භූමිං, මහාපෘථ්වීය; සත්තවාරෙකම්පෙත්වා, සත්වරක් කම්පා කරවා; (එයින් චුතව) සො, ඒ බොධිසත්ත්වතෙම; තුසිතපුරවරෙ, උතුම්වූ තුසිතපුරයෙහි; දෙවරාජාඅහූ, දිව්‍යරාජයෙක්ව උපන්සේක.

17. මහාබ්‍රහ්මසක්කාදයො, මහාබ්‍රහ්මරාජශක්‍රාදීවූ; දෙවරාජා, දශදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මයෝ; සමාගන්ත්වා, (තුසිතපුරයට) එකතුව අවුත්; තං බුද්ධඞ්කුරං නමිත්වා, ඒ බුද්ධාඞ්කුරයා වැඳ; මහාවීර, මහාවීරයාණෙනි; බුද්ධභාවං, බුදුබවට; අයං, මේ; කාලො, කල(හෙවත්)බුදුවීමට කල් සම්ප්‍රාප්තවීය; (එහෙයින්) ත්වං ච අපි, ඔබවහන්සේද; මනුස්සානලොකං, මිනිස් ලොවට; ගන්ත්වා,, ගොස්.

18. තස්මිං, ඒ මනුෂ්‍යලෝකයෙහි; වරංමාතුකුච්ඡිං, උතුම්වූ මව්කුස; ජනිත්වාන, ඉපද; තිලොකෙ, ලෝකත්‍රයෙහි; සදෙවං ජනං, දෙවියන් සහිතවූ ජනයා; තාරයන්තො, සසර කතරින් එතරකරන්නේ; ධම්මං, නිර්වාණධර්මය; සුඛං බුජ්ඣ ඉති, සැපසේ ඥාත් ඥාත් කලමැණවැයි; එවං, මෙසේ; වත්වාන, කියා; සමාරාධිතො, මොණවට ආරාධනා කරණු ලබන්නේ; දෙවලොකා, දිව්‍යලෝකයෙන්; චවිත්වා, චුතව.

19. උපචිතමිතපුඤ්ඤං කප්පලක්ඛං මහන්තං
ධිතිමති විරියාදීනං ගුණානං අගාරං,
ජනපමකුට භිඞ්ගා චුම්බිතං ඝාරවින්දං
පවර නරපතිං නිස්සාය සුද්ධොදනාඛ්‍යං.

20. විවිධවිපුලපුඤ්ඤං කප්පලක්ඛං කතාය
සතතවිමල සීලාලඞ්කතායච්ඡරාය,
අපහසවරමායා දෙවියා උත්තමාය
අවිගතසතියා උප්පජ්ජි සො තාය කුච්ඡිං.

21. මණිසමුග්ගමජ්ඣම්හි සොණ්ණරූපංව මාතුයා,
පස්සන්තියනෙතා වසං තත්ථ දසමාසව්හයාපන.

22. දෙවිස්සරස්ස වනනන්දනසන්නිභම්හි
උය්‍යානකෙ රුචිරලුම්බිනියා පසිද්ධෙ,
සම්ඵුල්ලිතම්හි වර මඞ්ගලසාලමූලෙ
සාඛං ගහෙත්ව ඨිත මාතුය කුච්ඡිතො තු.

---

19. කප්පලක්ඛං, කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි; උපචිත, රැස්කරණලද; අමිතං, ප්‍රමාණාතික්‍රාන්තවූ; මහන්තං පුඤ්ඤං, මහත් පින් ඇති; ධිතිමති විරියාදීනං, ධෘතිස්මෘතිවීර්‍ය්‍යාදිවූ; ගුණානං, ගුණරත්නයන්ට; අගාරං, වාසස්ථානවූ; ජනප, ජනපාලනයකරණ රජදරුවන්ගේ; මකුට, කිරීටාභරණ නමැති, භිඞ්ගා, භෘඞ්ගරාජයන් විසින්; චුම්බිත, සුම්බිතාලද ශ්‍රීපාද නමැති; අරවින්දං, පද්මයක් වැනිවූ; පවර, උතුම්වූ; තං සුද්ධොදනං නරපතිං නිස්සාය, ඒ සුද්ධොදන නම්වූ නරපතීහු නිසා.

20. කප්පලක්ඛං, කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි; විවිධ විපුලපුඤ්ඤං, නොයෙක විධවූ විපුලපුණ්‍යයන්; කතාය, කළාවූ; සතත, නිරන්තරයෙන් රක්නාලද; විමල, නිර්මලවූ; සීලාලඞ්කතාය, ශීලාලඞ්කාරයෙන් ශරහුණාවූ; අච්ඡරාය, දිව්‍යාප්සරාවට; අපහස, අපහසකරණලද; වර, ප්‍රවරවූ; උත්තමාය, උතුම්වූ; තාය මායාදෙවියා, ඒ මහාමායා දේවීන්ගේ; කුච්ඡිං, කුසෙහි; සො, ඒ බොධිසත්ත්වතෙම; අවිගතසතියා, නොහරණලද සිහියෙන් යෙදී; උප්පජ්ජි, ප්‍රතිසන්ධිග්‍රහණයකර වදාළසේක.

21. මණිසමුග්ගමජ්ඣම්හි, ස්ඵටික මිණිකරඬුවක්මැද උන්; සොණ්ණරූපංව, රන්පිළිමයක්මෙන්; මාතුයාපස්සන්තියනෙතා, මවුබිසවට පෙනෙමින්; තත්ථ, ඒ මවුකුස්හි; වසං, වාසයකරන්නේ; දසමාසව්හයා පන, දශමස් ඇවෑමෙන් වනාහි.

22. දෙවිස්සරස්ස, දෙවෙන්ද්‍රයාගේ; නන්දනවනසන්නිභම්හි, නන්දනවනෝද්‍යානය වැනිවූ; පසිද්ධෙ, ප්‍රසිද්ධවූ; රුචිර, සිත්කළුවූ; ලුම්බිනියා උය්‍යානකෙ, ලුම්බිණීනම් උයනෙහි; සම්ඵුල්ලිතම්හි, සොත්ඵුල්ලවූ; වර මඞ්ගලසාලමූලෙ, උතුම්වූ මඟුල් සල් වෘක්‍ෂමූලයෙහි; සාඛං ගහෙත්වා ඨිතං, සුපිපිසල්අත්තක් ගෙන සිටියාවූ; මාතුයාකුච්ඡිතො, මවුවූ මහාමායාදේවීන්ගේ කුක්‍ෂියෙන්.

23. ධම්මාසනාවනරමානකපණ්ඩිතොව
සො නික්ඛමි සුඛපසාරිත හත්ථපාදො,
අච්චන්තමානුසසරීරජිගුච්ඡමානා
බ්‍රහ්මාපි රාගවිගතා චතු දෙවරාජා.

24. සොණ්ණස්සජාල වර අජිනදීපිචම්මා
ගණ්හිංසු ගාරවයුතා අභිතුට්ඨචිත්තා,
ගණ්හිංසු මානුස වරා ච දුකූලකෙන
කම්පිත්ථ සාපි පඨවී මහතාරවෙන.

25. ලොකන්තරෙපි නිරයෙ ඝන අන්ධකාරෙ
ආලොක පාතුරහු සබ්බතමං නිහන්ත්වා,
සබ්බා දිසාච විදිසා අභවුං පසන්නා
තාරා ච චන්දසුරියා අභි ජොතයිංසු.

---

23. ධම්මාසනා, ධර්මාසනයකින්; අවනරමානක පණ්ඩිතොව, බස්නාවූ පණ්ඩිතයෙකුන් මෙන්; සුඛපසාරිත හත්ථපාදො, සැපසේ දිගුකරණ ලද හස්තපාදයන් ඇත්තාවූ; සො, ඒ මගනාතෝ; නික්ඛමි, නික්මුණුසේක; (එසේ නික්මුණු බෝසත්හු) අච්චන්ත, අතිශයින්; මානුසසරීර, මනුෂ්‍ය ශරීරය; ජිගුච්ඡමානා, පිළිකුල් කරන්නාවූ; රාගවිගතා, විගතරාගීවූ; බ්‍රහ්මාපි, බ්‍රහ්මරාජයෝද; චතුදෙවරාජා, සතරවරන් දෙව්රජහුද.

24. සොණ්ණජාලසා, රත්දැලින්ද; වර අජිනදීපිචම්මා, උතුම්වූ අඳුන් දිවිසම්හුද; ගාරවයුතා, ගෞරව ඇත්තාවූ; අභිතුට්ඨචිත්තා, අතිශයින් සතුටුවූ සිත් ඇත්තාහු; ගණ්හිංසු, පිළිගත්තාහුය; මානුසවරා ච, රජදරුවෝද; දුකූලකෙන, දුහුල්සුඹුලෙන්; ගණ්හිංසු, පිළිගත්තාහුය; (එකෙණෙහි) සා පඨවී අපි, ඒ පෘථිවියතොමෝද; මහතාරවෙන, මහත්රාවයෙන්; කම්පිත්ථ, කම්පාවූවාය.

25. ඝනඅන්ධකාරෙ, අන්ධකාරයෙන් ඝනවූ; ලොකන්තරෙනිරයෙ අපි, ලෝකාන්තරික නරකයෙහි පවා; සබ්බතමං නිහන්ත්වා, සියලු අඳුරු නසා; ආලොකපාතුරහු, ආලෝක ප්‍රාදුර්භූත විය; සබ්බාදිසා ච විදිසා, සියලු අනුදිශාහුද; පසන්නා අභවුං, ප්‍රසන්නාවූවාහුය; තාරාච, තාරකාවෝද; චන්දසුරියා ච, චන්ද්‍රසූර්‍යයෝද; අභිජොතයිංසු, අතිශයින් එළිවත්වූවාහුය.

26. ආකාසභූමිරතනා පි ච ජෝතයිංසු
සොගන්ධ සීතල මුදූ අනිලා අහෙසුං,
වෙගෙන සන්දන මහොඝ නදී සහස්සා
අස්සන්දනාව නදියො සකලා අහෙසුං.

27. වස්සිංසු කෙවල මහා චතු දීපකෙසු
සන්තො ච මාධුරජලොපි ච හූ සමුද්දො,
නාවා විදෙසපි ගතා පුන ආගමිංසු
කාකොලූකාන සහකීලනකං අහොසි.

28. සොණෙහි කීලනමිගා ච තදා අහෙසුං
පස්සිංසු පඞ්ගුලජනාව පි නච්චමන්ධා,
සාවෙනති බාධිරජනානපි ගීතමූකා
සම්පුණ්ණතොය ජලජා නිරයා අහෙසුං.

---

26. ආකාසභූමිරතනාපිච, ආකාසගතවූද භූමිගතවූද සියළු රත්නයෝ; ජොතයිංසු, දිප්තිමත්වූවාහුය; සොගන්ධ, සුවඳැත්තාවූ; සීතල, සිසිල්වූ; මුදූ, මෘදුවූ; අනිලා අහෙසුං, වාතයෝ ඇතිවූවාහුය; වෙගෙන සන්දන, වේගයෙන් ගලායන; මහොඝ, මහවතුරු ඇති; නදීසහස්සා, නදීසහශ්‍රයෝ; සකලා, සියල්ලම; අස්සන්දනාව, සන්දනය නොකරන්නාහුම(හෙවත් යටිගම්බලා වතුර නොගොස් හිඳබත) නදියො අහෙසුං, ගඟාවූවාහුය.

27. කෙවල චතුමහා දීපකෙසු, සියළු සතරමහද්වීපයෙහි; වස්සිංසු, එකපැහැර වර්ෂණයකළාහුය; සමුද්දො, සමුද්‍රයතෙම; සන්තොව, සන්සිඳුනේද විය; මාධුරජලොපි ච අහු, මියුරුජලය ඇත්තේදවී; විදෙසගතානාවාපි, පරදෙශයට ගියාවූ නෞකාවෝද; පුන ආගමිංසු, (තමන්ගේ දෙශවලට) නැවත ආවාහුය; කාකොළූකානං, කවුඩන් හා බකමුහුණන්ගේ; සහකීලනකං අහොසි, කැටිව ක්‍රීඩා ඇතිවිය.

28. තදා, එකල්හි; සොණෙහි කීලන මිගාව අහෙසුං, සුණඛයන්හා කෙළිනා මෘගයෝද ඇතිවූවාහුය; අන්ධා, ජාත්‍යන්ධයෝද; පඞ්ගුලජනා, පිළුන්ගේ; නච්චං පස්සිංසු, නැටුම් බැලුවාහුය; මූකා, ගොළුවෝ; බාධිර ජනානම්පි, ජාතිබධිරයන්ටද; ගීතං සාවෙනති, ගී ඇස්සූවාහුය; තොය සම්පුණ්ණ, සිහිල්දියෙන් පිරුණාවූ; ජලජා, පිපුම්ඇති; නිරයා අහෙසුං, නරකයෝවූවාහුය.

29. භුඤ්ජිංසු දිබ්බ වරභොජන පෙතලොකා
පක්ඛී නගන්ති ගගණෙ භුවි සඤ්චරිංසු,
ව්‍යාධීහි රොග භය සීතල දුහ මුත්තා
මුත්තා ච බන්ධනගතා සකලා අහෙසුං.

30. ලොකෙ විමාන සකලෙසු කවාටවාරා
තස්මිං ඛණෙ සකසකා විවරිංසු සබ්බෙ,
සත්තාඛිලා පියවදංව වදිංසු ලොකෙ
හෙසාරවං පියකරං ච රවිංසු අස්සා.

31. නාගානදිංසු නිඛිලා අති කුඤ්චනාදං
නාදං නදිංසු අධිකං ච තදා මිගින්දා,
නාදං නදිංසු තුරියා ච අවාදිතා ච
ආවාලිතා සකසකා භරණා චලිංසු.

---

29. පෙතලොකා, ප්‍රේතලොකවාසීහු; දිබ්බවරභොජනං, උතුම්වූ දිව බොජුන්; භුඤ්ජිංසු, (එදවස්) අනුභවකලාහුය; පක්ඛී, පක්ෂීහු; ගගණෙ නගන්ති, ආකාසයෙහි නොගොස්; භුවි සංචරිංසු, පෘථුවියෙහි සඤ්චාරණයකලාහුය; සකලා, සියළුසත්වයෝ; රොග, (පජ්ජරාදි) රොගය; භය, භයය; සීතල, (අධික) සීතලය; දුහ, (අධික) දුහය යන; ව්‍යාධීහි, ව්‍යාධිවලින්; මුත්තා, මිදීගියාහුය; බන්ධනගතා සකලා ච, බන්ධනගතවූ සියළු සත්වයෝද; මුත්තා අහෙසුං, මිදීගියාහුය.

30. ලොකෙ, ලෝකයෙහි; විමානසකලෙසු, සියළු විමන්හි; කවාටවාරා, දොරකවුළු; සබ්බෙ, සියලු; සකසකා, තෙමේ තොමේම; තස්මිං ඛණෙ, එකණෙහි; විවරිංසු, ඇරීගියාහුය; ලොකෙ, ලෙව්හි; අඛිලා සත්තා, සියළුසත්වයෝ; පියවදංව වදිංසු, (ඔවුනොවුන්ට) ප්‍රියවචනම කීවාහුය; අස්සා, අශ්වයෝ; පියකරං ච, ප්‍රියකරවූම; හෙසාරවං රවිංසු, හෙසාරවය පැවැත්වූවාහුය.

31. නිඛිලා, සියලු; නාගා, හස්තිරාජයෝ; අතිකුඤ්චනාදං නදිංසු, අධිකවූ කුඤ්චනාද පැවැත්තුවාහුය; තදා, එවේලෙහි; මිගින්දා, (මෘගෙන්ද්‍රසඞ්ඛ්‍යාත) සිංහරාජයෝ; අධිකං ච, අධිකතරකොටම; නාදං නදිංසු, සිංහනාද පැවැත්තුවාහුය; අවාදිතාව තුරියාව, කිසිකෙනෙකුන් විසින් නොවගනලදාවූ තූර්‍ය්‍යයෝද; නදිංසු, (තෙමේතෙමේම) නාද පැවැත්වූවාහුය; ආවාලිතා, නොසොල්වනලදාවූ; ආභරණා, ආභරණයෝ; සකසකා චලිංසු, තෙමේතෙමේම චලිතවූවාහුය.

32. වත්තයිංසු සුරාචා'පි සංගීතිං චතුරඞ්ගිකං,
රුක්ඛාලතායො ගුම්බාච පුප්ඵිංසු තෙ විසෙසතො.

33. ජලසසිලා පඨවීනං ඵලෙ භිඥිත්වා පරූපරි,
පදුමා පංචවණ්ණානි උඨිතා සත්තභූමකා,
අධොමුඛොලම්බකෙහි පදුමෙහාකිණ්ණකනනභෙ.

34. විතානම්පි අහු තස්මිං පාතුභූතෙ නරුත්තමෙ,
නාහුතෙ චක්කවාළෙසු වස්සිංසු දිබ්බ පුප්ඵකා.
වජ්ජිංසු ගගණෙ පංච අංගානි තුරියානිච.

35. එවං පවත්තෙසු නිමිත්තකෙසු
හට්ඨෙන බ්‍රහ්මාමරමච්චකානං,
කමෙන ගන්ත්වා අවනීසු පත්තො
ලොකුත්තමො සො අතුලො පසත්ථො.

---

32. සුරචාපි, දෙවියෝද; චතුරඞ්ගිකං සඞ්ගීතිං, චතුරඞ්ගසමන්විත ප්‍රීති ගීතිකාවන්; වත්තයිංසු, පැවැත්තුවාහුය; තෙ රුක්ඛා ලතායො ගුම්බාච, ඒ රුක් ලිය වනලැහැප්හුද; විසෙසතො, විශෙෂයෙන්; පුප්ඵිංසු, පිපිගියාහුය.

33. ජලසසිලා පඨවීනං, ජලය සිලාය පෘථිවිය යනමොවුන්ගේ; ඵලෙ, මස්තකස්ථලයන්; භිඥිත්වා, බිඳගෙණ; පඤ්චවණ්ණානි, පස්වණක් පැහැයෙන්යුක්තවූ; උපරූපරි, මතුමත්තෙහි; සත්තභූමකාපදුමා, සත්බුමු මහ පියුම්හු; උඨිතා, පැනනැංගාහුය; නභෙ, අහසෙහි; අධොමුඛා, අධොමුඛවූ; ඔලම්බකෙහි පදුමෙහි; ලම්බමාන පියුම්වලින්; ආකිණ්ණකං, ගැවසීගත්තාවූ.

34. තස්මිං පාතුභූතෙ නරුත්තමෙ, ඒ නරෝත්තමයා ලොව පහළවූ කල්හි; විතානම්පි අහු, (කියනලද ප්‍රකාර ඇති) වියන්හුද ඇතිවිය; නාහුතෙ චක්කවාළෙසු, දශදහසක් සක්වලෙහි; දිබ්බපුප්ඵකා වස්සිංසු, දිව්මල් වර්ෂාවෝ වැස්සාහුය; ගගණෙ, ආකාශයෙහි; පංච අංගානි තුරියානි ච, පචඞ්ගිකතූර්‍ය්‍යයෝද; වජ්ජිංසු, පැවතුනාහුය.

35. එවං පවත්තෙසු නිමිත්තකෙසු, මෙසේ පවත්නානලද නිමිත්තයන්ඇතිකල්හි; බ්‍රහ්මාමරමච්චකානං හට්ඨෙන, බඹ සුර නරනතින්; කමෙනගන්ත්වා, ක්‍රමයෙන් ගොස්; අතුලො, අතුල්‍යවූ; පසත්ථො, ප්‍රසස්ථවූ; සො ලොකුත්තමො, ඒ ලොකොත්තමතෙම; අවනිසුපත්තො, අවනිප්‍රාප්තවූයේ.

36. සරදසමය චන්දෙ සබ්බලොකප්පසාදෙ
සුකතසතපුඤ්ඤලද්ධො ලක්ඛණාකිණ්ණ දෙහො,
නිඛිල සුරනරානං මොළිලඞ්කාර පාදෙ
විබුධසුරනරානං කිත්තිඝොසෙනුපෙතො.

37. රජනිකරදිනින්දෙ කන්තිතෙජෙනුපෙතො
වජිරයුධසඝොස දුල්ලභො පඤ්ඤසාරො
ජලධිරිව ගම්භීරො නිබ්බිකාරොවකාසො
නිඛිල දසවිධානං පාරගො පාරමීනං.

38. කෙවලො ගුණරූපොව දයාරූපොව කෙවලො,
කෙවලො ඤාණරූපොව තෙජරූපොව කෙවලො
පාරමී විස්සකම්මෙන මාපිතො විය කෙවලො.

---

36. සරදසමයචන්දෙ, සරත්කාලයෙහි චන්ද්‍රයාසෙයින්; සබ්බලොකප්පසාදෙ, සියලු ලෝවැස්සන්ට ප්‍රසාදජනකවූසේක්; සුකතසතපුඤ්ඤලද්ධො, සුකෘත සහස්‍රයන් කරණකොටගෙන මනාවලද්දාවූ; ලක්ඛණා, ලක්ෂණයෙන්; ආකිණ්ණදෙහො, ආකීර්ණවූ දෙහ ඇති සේක්; නිඛිලසුරනරානං, (ප්‍රසාදයෙන්නැමෙණ) සියලු දෙව්මිණිසුන්ගේ; මොළිලඞ්කාරපාදෙ, කිරුළු සරහන පාද ඇතිසේක්; විබුධසුරනරානං, ප්‍රඥාවන්තවූ දිව්‍ය මනුෂ්‍යයන් විසින් පවත්වනලද; කිත්තිඝොසෙනුපෙතො, කීර්තිඝොෂාවෙන් උපලක්ෂිතවූසේක්.

37. රජනිකරදිනින්දෙ, චන්ද්‍රයා හා දිනෙන්ද්‍ර යනමොවුන්ටවඩා; කන්තිතෙජෙනුපෙතො, කාන්තිහා තෙජසින් යුක්තසේක්; වජිරයුධසඝොස, වජ්‍රායුධසඞ්ඝශ්‍රයකිනුත්; දුල්ලභො, කැපිමටදුර්ලභවූ; පඤ්ඤසාරෙ, ප්‍රඥාසාරයක් ඇතිසේක්; ජලධිරිවගම්භීරෙ, සමුද්‍රයයේ ගැඹුරුවූ; නිබ්බිකාරෙවකාසො, අවකාශයෙහිනිර්විකාරවූසේක්; නිඛිලදසවිධානං පාරමීනං, දශවිධවූ සියළුපාරමිතාවන්ගේ; පාරගො, පරතෙරට පැමිණිසේක්.

38. කෙවලො ගුණරූපොව, හුදු ගුණරූපයක් වැනිසේක්; (හෙවත්) අන්කිසිවකින් අමිශ්‍රවූ එකම ගුණයෙන් මවාළූ රූපයක් වැනිසේක්; කෙවලො දයාරූපොව; එසේ එකම දයාවෙන් මවාළූ රූපයක් වැනිවූසේක්; කෙවලො ඤාණරූපොව, හුදු ඤාණරූපයක් වැනිවූසේක්; කෙවලො තෙජරූපොව, සුඛ තෙජසින් මවාළූ රූපයක් වැනිවූසේක්; කෙවලො පාරමී, හුදු පාරමිතානමැති; විස්සකම්මෙන, විස්කම් දෙව්පුත් විසින්; මාපිතො විය, මවාපෑවාක් වැනිවූසේක.

39. සුප්පතිට්ඨිතපාදද්දි ද්වත්තිංසවරලක්ඛණො,
ව්‍යාමප්පභා පරික්ඛිත්ත රූපලීලා අනූපමො,
පුඤ්ඤසංභාර භරිත සන්තාන විසෙසකො.

40. මොහඅන්ධනුදදිච්චො ලොකස්ස නයනො විය,
කරුණාජලප්පවාහොව සෙතු සංසාරසාගරං
කරුණාජලමාධාරො සන්තොසජලසාගරො.

41. ධම්මද්ධජෙ වෙළු යට්ඨි පඤ්ඤාචක්කස්ස නාභිකො,
පලයානලකො ලොභ සාගරස්ස විසොසනෙ,
මහානුභාව මන්තොව කොධ සප්ප නිවාරණෙ.

42. තදහුපි පන ජාතො සොළසබ්බස්සිකොව
අවසනධරකොපි කාසිචෙලධරොව,
නව සකල අලඞ්කාරොප ලඞ්කාරකොව
ධරණී ගමනිකොආකාසගච්ඡංච පස්සං.

---

39. සුප්පතිට්ඨිතපාදද්දි, සුප්‍රතිෂ්ඨිතපාදද්දිවූ; ද්වත්තිංසවරලක්ඛණො, උතුම් ලකුණු දෙතිසක් ඇති සෙක්; ව්‍යාමප්පභා පරික්ඛිත්ත, ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් පරික්ෂෙපවූ; රූපලීලා, රූපලීලාවෙන්; අනූපමො, අනූපමවූසේක්; පුඤ්ඤසම්භාරභරිත, කුශලසම්භාරයෙන් භරිතවූ; සන්තාන විසෙසකො, සන්තානවිශෙෂ ඇතිසේක්;

40. මොහඅන්ධනුදෙ, මොහනමැති අඳුරුනැසීමෙහි; ආදිච්චො, ආදිත්‍යයාවැනිවූසේක්; ලොකස්ස, ලෝකයාට; නයනො විය, ඇසක්වැනිවූසේක්; කරුණාජල, කරුණානමැති ජලයාගේ; පවාහොව, ප්‍රවාහයක් (වතුරක්) වැනිවූයේක්; සංසාරසාගරං, සසරසයුරට; සෙතු, හෙයක් වැනිවූයේක්; කරුණාජලං, කරුණා නාමැති ජලයට; ආධාරෙ, උත්පත්ති ස්ථානවූසේක්; සන්තොසජල, සන්තොසනාමැති ජලයට; සාගරෙ, සාගරය වැනිවූසේක්.

41. ධම්මද්ධජෙ, ධර්මධ්වජය නැඟීමෙහි; වෙළුයට්ඨි, වංශයෂ්ටියක් බඳුවූසේක්; පඤ්ඤාචක්කස්ස, ප්‍රඥානමැති චක්‍රයාගේ; නාභිකො, නාභියක් වැනිවූසේක්; ලොභසාගරස්ස, ලොභනමැති සාගරය; විසොසනෙ, වියලීමෙහි; පලයානලකො, යුගාන්ත වහ්නියක් වැනිවූසේක්; කොධසප්ප නිවාරණෙ, ක්‍රොධනමැති සර්පයාගේ නිවාරණයෙහි; මහානුභාවමන්තොව, මහානුභාව ඇති මන්ත්‍රයක් වැනිවූසේක්.

42. තදහුපි පන ජාතො, එදවස උපන්සේකුත්; සොළසවස්සිකොව, සොළොස්හැවිරිදි පිරුණාක්හුමෙන්ද; අවසනධරකොපි, නග්නවූසේක්ද; කාසිචෙලධරොව, කසීවස්ත්‍ර දරුවක්හු මෙන්ද; නව සකල අලඞ්කාරොපි, සියළුම අලඞ්කාරයන් නැතිසේකුත්; අලඞ්කාරකොව, සර්වාභරණයෙන් සැරහුනාක්හුමෙන්ද; ධරණීගමනිකො, භූමියෙහි වඩනාසේක්; ආකාසගච්ඡංච, ආකාශයෙහි යන්නාක්හු මෙන්ද; පස්සං, සියළු ලොවට පෙණෙනාසේක්.

43. චරණකමලතො සො උත්තරං ගන්ත්ව ධීරො
නවවිකසිතගබ්භෙ කාමලෙ ගන්ධකංව,
සහජමුඛසුගන්ධා ලොකගන්ධං කරොන්තො
ජගති අසමකන්තා සීහනාදං නදිත්ථා.

44. අථ ජලනිධිඝොසෙ සන්නිභෙ භෙරි ඝොස
පපභුති තුරියඝොසෙ වජ්ජයන්තෙ හිචෙව,
අගණිතවිවිධෙ තෙ මඞ්ගලෙ චෙව නීතො
සුරභවනසමානං රාජගෙහං කමෙන.

45. ජගතිසුත මහිද්ධි දෙවලීසිස්ස සීසං
චරණකමලතොලඞ්කාර කත්වා තථෙව,
අවනිපති නරින්දස්සාපි සුද්ධොදනස්ස
චරණපදුමරාගා මොළි ජොතිං කරිත්ථා.

---

43. සො ධීරෙ, ඒ ප්‍රාඥතෙම; චරණකමලතො, ශ්‍රීපාදපද්මයෙන්; උත්තරං, උතුරුදෙසට; ගන්ත්වා, සත්පියවරක්ගොස්; නවවිකසිත, අභිනව ප්‍රබොධවන්නාවූ; කාමලෙගබ්භෙ, මනනොල්මල් ගර්භයෙක්හි; ගන්ධකංව, මනොඥගන්ධයක් බඳුවූ; සහජමුඛසුගන්ධා, සහජවූ මුඛසුගන්ධයෙන්; ලොක, සියලු ලෝකයා: ගන්ධං කරොන්තො, සුවඳකරණයේක්; ජගති අසමකන්තා, ජගත්‍රයෙහි අසමබැවින්; සීහනාදං නදිත්ථා, (අග්ගොහමස්මි ලොකස්ස, යනාදීන්) සිංහනාදකොට.

44. අථ, සිංහනාදකල ඉක්බිති; ජලනිධිඝොසෙ සන්නිභෙ, සමුද්‍රඝොෂාවක් බඳුවූ; භෙරිඝොසප්පභුති, භෙරිඝොෂාව ප්‍රභෘතිකොට ඇති; තුරියඝොසෙ, තූර්‍ය්‍යඝොෂාවන්ද; අගණිත, අගණිතවූ; විවිධ, නානාවිධවූ; තෙ මඞ්ගලෙචෙව, එම මඟුල් සිරිතුඳු; වජ්ජයන්තෙ හිචෙව, දිව්‍යමනුෂ්‍යයන්විසින් පවත්වනලදකල්හිද; කමෙන, ක්‍රමයෙන්; සුරභවනසමානං, දිව්‍යභවනසන්නිභවූ; රාජගෙහං, රාජගෘහයට; නීතො, පමුණුවනලද්දේ.

45. ජගති සුත, ජගත්‍රයෙහි ප්‍රසිද්ධවූ; මහිද්ධි, මහත්වූ ඍද්ධි ඇති; දෙවලඉසිස්ස, කාලදෙවලඍෂීන්ගේ; සීසං, හිස; චරණකමලතො, චරණකමලයුග්මයෙන්; අලඞ්කාරං කත්වා, සරසා; තථෙව, එපරිද්දෙන්ම; අවනිපති, පෘථිවීපතිවූ; සුද්ධොදනස්ස නරින්දස්සාපි, සුද්ධොදන නරේන්ද්‍රයාගේද; මොළි, මොලිය; චරණපදුමරාගා, ශ්‍රීපාද නමැති පද්මරාග මාණික්‍යයෙන්; ජොතිං කරිත්වා, ජොතිමත්කරමා.

46. රජනිකරකම්බු සත්තවස්සී තදා තු
රතනමය සහස්සවඩ්ඪක තිත්ථෙ සතංච,
රතනපුලින ආකිණ්ණාය රෙඛාය තීර
පවර සලිලකීලං පොක්ඛරඤ්ඤා කරොන්තො.

47. ඉව තිදිවකුමාරො වඩ්ඪමානො කමෙන
ජිතාහිමිසධජො රූපෙන පත්තො මහන්තං,
නිහිතචරණ පීඨෙ නෙක භූපාල මොළී
අසදිස අභිසෙකං සොළසබ්දස්ස කාලෙ.

48. සුනීල කෙසච ලතා තමාලභං
සුපුණ්ණචන්දකන්ති සොම්මවත්තකං,
සුබුද්ධ නීලම්බුජ නීල නෙත්තකං
සුරින්දචාපබ්භමුකං සවංකකං.

---

46. රජනිකරකම්බු,(පුරපෑලවියපටන් ක්‍රමයෙන්වැඩෙන) චන්ද්‍රයාසේ වැඩෙන්නේ; සත්තවස්සී, සත්හැවිරිදිවූයේක්; තදාතු, එකල්හි වනාහි; රතනමයං, සත්රුවන්මයවූ; සහස්සංවඩ්ඪකං, දහසක් වන්ඇති; සතච තිත්ථෙ, සියයක්තොටද ඇති; රතනපුලින, රන් වැලිතලා ඇති; තීර රෙඛාය, තීරරෙඛාවෙන්; ආකිණ්ණාය, ගැවසීගත්තාවූ; පොක්ඛරඤ්ඤා, විස්කම්දෙව්පුත් මැවූ පොකුණෙහි; පවරසලිලකීලං කරොන්තො, උතුම්වූ ජලක්‍රීඩාකරන්නේ.

47. තිදිවකුමාරොඉව, දෙව්ලොව දෙව්කුමරකුමෙන්; කමෙනවඩ්ඪමානො, ක්‍රමයෙන් වැඩෙනාසේක්; රූපෙන, රූපයකරණකොටගෙණ; ජිතාහිම්සධජො, ජයගත්තාලද මකරධ්වජය ඇත්තේක්; නෙකභූපාලමොළී, අනෙක භූමිපාලයන්ගේ මොළී නමැති; පීඨෙ, රත්න පීඨයෙහි; නිහිත, තබනලද; චරණ, ශ්‍රීපාද ඇති; (ඒ සබෝසතාම තෙම) සොළසබ්දස්සකාලෙ, සොළොස්හැවිරිදිකල්හි; මහන්තං අසදිසාභිසෙකං, මහත් වූ(සියලුභූමි මණ්ඩලයෙහි) අසදෘශාභිෂේකයට; පත්තො, ප්‍රාප්තවූයේක්.

48. ලතාතමාලභං, තමලලියසේ; සුනීලකෙසං, අතිනීල කෙසකලාප ඇති; සුපුණ්ණචන්දකන්ති, සම්පූර්ණ චන්ද්‍රමණ්ඩලයට බඳුවූ ආකෘති ඇත්තාවූ; සොම්මවත්තකං, සමමුහුණු ඇති; සුබුද්ධං, සුප්‍රබොධවූ; නීලම්බුජ; නිල්උපුල් බඳුවූ; නීලනෙත්තකං, සුනිල නෙත්‍ර ඇති; සුරින්දචාප, ඉන්ද්‍ර චාපවැනිවූ; සවංකකං, වක්වූ; භමුකං, බැමයුගල ඇති.

49. සුරත්ත දන්තාවරණේන සොභිතං
සුකුන්දපුප්ඵාකති දන්ත සොභිතං,
පයොධරා සොණ්ණකහංසසඞ්ගමං
ධාරාවගඞ්ගාකති මුත්තහාරකං.

50. සුමෙඛලා සොභ කටිප්පදෙසකං
කරීකරො පුණ්ණ සමොරුචන්දකං,
සනාදපාදං වලයාමණීයුතං
අලත්තපිණ්ඩා කති පාදමම්බුජං.

51. අනඞ්ග ආසඞ්ගභිවඩ්ඪනාරහං
සුරඞ්ගනා නිජ්ඣිත රූපධාරිතං,
අනන්තපුඤ්ඤං සුචිරං කතං වරං
යසොධරං තං අමිතං යසන්ධරං

---

49. සුරත්ත, අභිරක්තවූ; දන්තාවරණේන, දන්තාවරණයෙන්; සොභිතං, හොබනාවූ; සුකුන්දපුප්ඵාකති, යහපත් කොඳ කැකුළුවැනි; දන්ත සොභිතං, දසනයන් සෝභමානවූ; පයොධරා, පයොධර නමැති; සොණ්ණකහංස, සවර්ණහංසයන්ගේ; සඞ්ගමං, සංගමප්‍රාප්තවූ; ගඞ්ගාධාරාව ආකති, ගඞ්ගාජලධාරාවක්සේ බබලන්නාවූ; මුත්තහාරකං, මුක්තාහාර ඇති.

50. සුමෙඛලාසොභ, යහපත් මෙවුල්දමින් හොබනාලද; කටිප්පදෙසකං, ජඝනප්‍රදෙශ ඇති; කරීකරෙ, ඇත්සොඬක්සේ; පුණ්ණ, ක්‍රමයෙන් පිරුණාවූ; සමොරුචන්දකං, සමවූ ඌරුයුග්ම ඇති; මණීවලයායුතං, මිණිවලලෙලන්යුක්තවූ; සනාදපාදං, නාද සහිත පා ඇති (හෙවත්) පියෙහි පියෙහි පවත්වනලද මිණිවලලෙලනි නාද ඇති; අලත්තපිණ්ඩා කති, අලත්පිඬුවැනිවූ; පාදම්බුජං, පාපියුම් ඇති.

51. අනඞ්ග, කාමෙශ්වරයාගේ; ආසඞ්ග, ඇල්ම; අභිවඩ්ඪනාරහං, විශෙෂයෙන් වඩනට සුදුසුවූ; සුරඞ්ගනා, සුරාඞ්ගනාවන්ට; නිජ්ඣිත, නිජ්ඣ කරණලද; රූපධාරිතං, රූ දැරූවාවූ; සුචිරං කතං, බොහෝ කාලයක් මුලුල්ලෙහි රැස්කරණලද්දාවූ; අනන්තපුඤ්ඤං, අපමණ කුසල් ඇති; වරං, උතුම්වූ; අමිතං යසධරං, දරණලද අපමණ යසස්ඇති; තං යසොධරං, ඒ යශෝධරානම් බිසව.

52. කඤ්ඤා අග්ගං මහෙසිං සුරපුරසදිසෙ කාපිලව්හෙ පුරම්හි
රූපං සද්දං ච ගන්ධං රසමභිමධුරං ඵස්සමෙ පඤ්චකාමෙ,
භිඤ්ජන්තො දෙවරාජා විය අපරදිනෙ කාමරාගාභිභූතො
දිස්වා නෙමිත්තකෙ තෙ වරසුතරතනෙ රාහුලෙ චෙව ජාතෙ.

53. රම්මං චාපි සුරම්මකං සුභමිති රම්මෙම්පි තෙ මන්දිරෙ
රම්මං පොක්ඛරණිංච නන්දනවනසඞ්කාස උය්‍යානකං,
රම්මං බන්ධුජනංච රාහුලසුතං රජ්ජං ධනං තං පුරං
රම්මං තව යසොධරං සහඛිලං තුවජ්ජාහි ගෙහසුඛං.

---

52, අග්ගං මහෙසිං කඤ්ඤා, (ශ්‍රෙෂ්ඨාවූ) යශෝධරාවන් අගමෙහෙසුන් කොට; සුරපුරසදිසෙ, දිව්‍යපුරයක් වැනිවූ; කාපිලව්හෙ පුරම්හි, කපිලවස්තුනම් පුරයෙහි; රූපං, (නයනනාමාවූයසිවූ) රූපය; සද්දං, (කණ්නාමාවූයසිවූ) ශබ්දය; ගන්ධංච (ඝ්‍රාණනාමාවූයසිවූ)ගන්ධයද; අභිමධුරං, ඉතා මිහිරිවූ; රසං, රසයද; ඵස්සං, (ශරීරසුඛස්පර්ශනීයවූ) ස්පෘෂ්ටව්‍යයද යන; ඉමෙ පඤ්ච කාමෙ, මෙකී පංචකාමයන්(හෙවත් මේ පංචකාම සැපයන්;) දෙවරාජාවිය, දෙදෙව්ලොවට අධිපති සක්දෙව්රජහු සෙයින්; භිඤ්ජන්තො, විඳිනායේක්; අපරදිනෙ, මෑතකාලයෙහි; * කාමරාගාභිභූතො, පංචකාමරාගයෙන් වෙසෙසින් මඩනාලද්දේ; තෙ නෙමිත්තකෙ දිස්වා,(ජිණ්ණ ව්‍යාධි මෘත ප්‍රව්‍රජිත රූප සඞ්ඛ්‍යාත දෙවනිර්මිත ඒ නෛමිත්තක යනුදු දැක; රාහුලෙ, රාහුලාභිධානවූ; වරසුතරතනෙචෙවජාතෙ, උතුම්වූ පුත්රුවනද උපන්කල්හි.

53 රම්මංචාපි, රම්‍යනම්වූ මන්දිරයද; සුරම්මකං, සුරම්මනම්වූ මන්දිරයද; සුභමිති, සුභනම්වූ මන්දිරයද; රම්මෙ, සිත්කලුවූ; තෙ මන්දිරෙපි, (තුන් ඍතුවට සුදුසුවූ) ඒ මන්දිරයන්ද; රම්මං, සිත්කලුවූ; පොක්ඛරණිංච, (දහසක්වන් ඇත සියත්නොවඇති රන්වැල්ලෙන් ගැවසීගත් තීරරෙඛා ඇති පිරිසිදු ජලයෙන් පිරුණු සුපිපි රත්පාදුම සෙවනපදුම ඇඹුල උපුලාදීන් යුක්තකොට විස්කම්දෙව්පුත් විසින් මවාලූ) දිව්‍යමය පුෂ්කරණීයද; නන්දනවනසංකාසං, නන්දනොද්‍යානය වැනිවූ; රම්මං උය්‍යානකං, සිත්කලුවූ උයනද; රම්මංබන්ධුජනං, සිත්කලුවූ (අසූදහසක් පමණ ප්‍රසිද්ධ) බන්ධුජනයාද; රම්මං රාහුලසුතං, සිත්කලුවූ රාහුල පුත්රුවනද; රම්මංරජ්ජං, සිත්කලුවූ රාජ්‍යයද; රම්මං ධනං, සිත්කලුවූ ධනයද; රම්මං තං පුරංච, සිත්කලුවූ ඒ නුවරද; රම්මං, අභිරම්‍යවූ; තං යසොධරංසහ, (සතලිස්දහසක් රාජකන්‍යාවන්ට අග්‍රවූ) ඒ යසොධරාදේවීදයනා; අඛිලං ගෙහසුඛං, යනොතනා මේ සියලු ගිහිගෙයි සැපත; තුවජ්ජහි, තුවජ්ජසි.

---

* මෙහි දිනශබ්දය කාලවාචී හෙයින් මෑතකාලයෙහිය.

54. කාමච්ඡන්දපහීණතො අසුභතො පස්සං සුසානං විය
කප්පග්ගී අවරුද්ධකං තිණකුටිං මඤ්ඤාචලොකාඛිලං,
අග්ගීඑකදසාමතාසලිලතො ධංසෙසි ඉච්ඡාදයො
සද්ධිං තෙන අමච්චකෙන තුරගං ආරුය්හ තං කන්ථකං.

55. පූජිතො දිබ්බවත්ථාභරණකුසුමකාදීහි බ්‍රහ්මාමරෙහි
කාරෙන්තො දිබ්බපුප්ඵා අඛිලගගනකං මෙඝපුණ්ණද්දිනංව,
යාවබ්‍රහ්මානලොකා තිදිවතුරියඝොසාය නාදං කරොන්තො
රත්‍යා සො යොජනානං තිදසමිත අනොමානදිං ගන්ත්වමග්ගා.

56. ඡන්නාඉමං තුරගමාභරණෙ ගහෙත්වා
ගච්ඡාහි එත්ථ නගරස්ස ච පෙසයිත්වා,
ධංසෙත්ව අන්ධනිඛිලෙ සුරියුග්ගතස්මිං
ඡෙත්වාන උත්තමසිනා සහමොලි කෙසෙ.

---

54 කාමච්ඡන්දපහීණතා, කාමච්ඡන්දය ප්‍රහීණබැවින්; අසුභතො, අසුභ වශයෙන්; සුසානං විය පස්සං, අමුසොහොනක්මෙන් දක්නායේක්; ලොකාඛිලං, සියලුලෝකය; කප්පග්ගි අවරුද්ධකං, ප්‍රලයාග්නියෙන් වටකරණලද; තිණකුටිං මඤ්ඤාච, තෘණකුටියක්මෙන් සිතාද; එකාදසඅග්ගි, (ලොකත්‍රයෙහි වැදගත්තාවූ) රාගාදී එකොළොස්මහ ගින්න; අමතසලිලතො, නිර්වාණාමෘතජලයෙන්; ධංසෙසි, නසමියන; ඉච්ඡා, ඉච්ඡාවහා; දයො, කරුණාඇතියේක්; තෙනඅමච්චකෙන සද්ධිං, ඒ ඡන්නනම් අමාත්‍යයාසමග; කන්ථකං, කන්ථකනම්වූ; තං තුරගං ආරුය්හ, ඒ අශ්වරාජයා පිටට නැඟී.

55. බ්‍රහ්මාමරෙහි, බ්‍රහ්මයන් හා දෙවියන්විසින්; දිබ්බවත්ථාභරණ, දිව්‍ය වස්ත්‍රාභරණ හා; කුසුමකාදීහි, දිව්‍යමල්ආදීන්ගෙන්; පූජිතො, පුදනලදයේක්; අඛිලගගනකං, සියලු නභස්තලය; දිබ්බපුප්ඵා, දිව්‍යපුෂ්පයෙන්; මෙඝපුණ්ණද්දිනංව, මෙඝයෙන් පිරුන දිනයක්මෙන්; කාරෙන්තො, කරවනයේක්; බ්‍රහ්මානංලොකා, බ්‍රහ්මයන් සම්බන්ධිවූ ලොකය (නොහොත්) බඹලොව; යාව, යම්තාක්ද ඒතාක්; තිදිවතුරියඝොසාය, දිව්‍යවූ තූර්‍ය්‍යඝොෂාවෙන්; නාදංකරොන්තො, එකනින්නාදකරණයේක්; සො, ඒ බොධිසත්වතෙම; යොජනානං, යොදුන්සම්බන්ධිවූ; තිදසමිත, දශත්‍රයකින් ප්‍රමිතවූ; (නොහොත් තිස්යොදුනක්පමණඇති;) මග්ගා, මගින්; රත්‍යා, රාත්‍රියෙහි; අනොමානදිං ගන්ත්වා, අනෝමානම් ගඞ්ගාවට ගොස්.

56. ඡන්නා, ඡන්නනම් ඇමතිය; ඉමංතුරගං, මේ අශ්වරාජයාද; ආභරණෙ, තමාගේ රාජාභරණයන්ද; ගහෙත්වා, ඇරගෙණ; නගරස්ස ගච්ඡාහි එත්ථ, නුවරටයවයි කියා; පෙසයිත්වාච, ඡන්නාමාත්‍යයා ගමන්දකරවා; අන්ධනිඛිලෙ ධංසෙත්වා, සියළු අන්ධකාරය නසා; සුරියුග්ගතස්මිං, හිරුඋදෑවූකල්හි; සහමොලි, චූළු ඔටුනු සහිතවූ; කෙසෙ, කෙසයන්; උත්තම අසිනා, උතුම්වූ ඛඩ්ගයෙන්; ඡෙත්වාන, ඡෙදනයකොට.

57. නභං ඛිපිත්වා වර බ්‍රහ්මරාජිනා
සමාහතෙට පතිත තිචීවරාදයො,
ගහෙත්වා වීරො සුනිවත්ථ පාරුතො
හරිත්වා කාසං පන පුබ්බසාටකෙ.

58. පබ්බජිතො සයමෙව ඉතී සො අම්බවනෙ වරමල්ලධිපානං,
තෙනජපීතිසුඛං වර පීණං වාසමකප්පයි සත්තදිනානි.

59. දීපොතිලොකවතුලො පි ස බොධිසත්තො
සන්තින්ද්‍රියො හතරජො අරහද්ධජෙන
චන්දො යථා සරදකෙ අභිජොතමානො
සන්තෙන දන්තගමනෙන ගජින්දකොව.

60. රාජගහභවනය මහා වරරාජධානිං
එකාහතො තිදසයොජන මග්ගගන්ත්වා,
තස්මිංතු ඉස්සරමදෙන පමාදකානං
හාසං කරං ඉව සකෙන විලාසකෙන.

---

57. නභං ඛිපිත්වා, (ඡේදනයකළ ධම්මිල්ලය) අහසට දමා; වර බ්‍රහ්මරාජිනා, උතුම්වූ මහාබ්‍රහ්මරාජයා විසින්; සමාහතෙට, එලවනලද; පතිතතිචීවරාදයො, පාත්‍ර තුන්සිවුරු ආදිය; ගහෙත්වා, පිළිගෙණ; සුනිවත්ථපාරුතො, සුනිවත්ථසුප්‍රාවෘතවූයේක්; වීරො, මහාවීරතෙමේ; පුබ්බසාටකෙ පන, පූර්වසළු යුගලයවනාහි; ආකාසං හරිත්වා, අහසටදමා.

58. ඉති, මෙසේ; සයමෙවපබ්බජිතො, තමාමෙම පැවිදිවූ; සො, ඒ මහානාතෙනෝ; තෙනජ, ඒ ප්‍රව්‍රජ්‍යාව හෙතුකොටගෙණ උපන්නාවූ; වර පීතිසුඛං, උතුම්වූ ප්‍රීතිසැපය; පීණං, පිඳිනාසේක්; වරමල්ලධිපානං, මල්ලව නරෙන්ද්‍රයන්ගේ; අම්බවනෙ, අනුපියනම් අඹවනයෙහි; සත්තදිනානි, සත්දවසක්; වාසං අකප්පයී, වාසයකළසේක.

59. තිලොක, භුවනත්‍රයට; අතුලො දීපො, අතුල්‍ය ප්‍රදීපයක්වැනිවූ; සො බොධිසත්තො, ඒ බොධිසත්වතෙම; සන්තින්ද්‍රියො, ශාන්තවූඉන්ද්‍රියයන් ඇත්තේ; හතරජො, නැසූවාවූ කෙලෙශ් ඇත්තෝ; අරහද්ධජෙන, අර්හද්ධ්වජසඞ්ඛ්‍යාතවූ චීවරධාරණය හෙතුකොටගෙණ; සරදකෙ, සරත්කාලයෙහි; චන්දොයථා, චන්ද්‍රයාමෙන්; අභිජොතමානො, අතිශයින් බබලනසේක්; සන්තෙන දන්තගමනෙන, ශාන්තදාන්ත ගමන්හේතුකොටගෙණ; ගජින්දකොව, ගජෙන්ද්‍රයකුසෙයින් හොබනාසේක්.

60. රාජගහභවනය, රජගෘහනම්වූ; මහාවරරාජධානිං, මහත් උතුම්වූ රාජධානියට; එකාහතො, එකදවසින්ම; තිදසයොජනමග්ගගන්ත්වා, තිස්යොදුන් මග ගෙවා ගොස්; තස්මිංතු, එහි වනාහි; ඉස්සරමදෙන පමාදකානං, ඉසුරුමදින් ප්‍රමාදවූවන්ට; සකෙන විලාසකෙන, ස්වකීයවූ විලාසය කරණකොටගෙණ; හාසඞ්කරංඉව, පරිහාසකරණකෙණකුන් මෙන්.

61. චාරොරුරූපසිරියා ගුණතො ජනානං
ආකඩ්ඪකො ඉව ච අත්තනි නෙත්තපීතෙන,
පිණ්ඩාය තත්ථ සුචිරං විනයානුකූලං
ලද්ධං ගහෙත්වා සකයාපනමත්තභික්ඛං.

62. කාමිස්සරො හිමකරො රවි බ්‍රහ්මරාජා
නාගාදිකෙස්වයමඤ්ඤතරොහි කොචි,
කොතූහලෙනගරවාසිකානෙකසත්තා
මඤ්චාවලෙන උදධිංව ලොලයිංසු.

63. ඡායාපණ්ඩවචලස්ස ගතො නිසජ්ජ
තං පච්චවෙක්ඛණවසෙන ච යොනිසො සො,
නානාරසෙහි සපදානවසෙන ලද්ධං
දෙවාන දිබ්බවරභොජනකංව භුත්වා.

---

61. චාරු, මනොඥවූ; උරු, මහත්වූ; රූපසිරියා, රූපශ්‍රීයෙන්ද; ගුණතො, නාදෘශවූ ගුණයෙන්ද; ජනානං, (රාජගෘහවාසී) ජනයන්ගේ; නෙත්තපීතෙන, නෙත්‍ර හා සිත්; අත්තනි, තමන්කෙරෙහි; ආකඩ්ඪකො ඉව ච, අදනාක්හුමෙන්ද; තත්ථ, ඒ පුරයෙහි; විනයානුකූලං, විනයානුකූලව; (නොවත් සූපව්‍යඤ්ජනවිඥප්ත්‍යාදී) භික්ෂාචාරවත්වූපරිද්දෙන්; පිණ්ඩාය, පිඬුපිණිස; සුචිරං, මනාව හැසිරෙණසේක්; සකයාපනමත්තං, ස්වකීය යාපනමාත්‍රවූ; ලද්ධං භික්ඛං ගහෙත්වා, ලද භික්ෂාව ගෙණ.

62. කාමිස්සරො, අනඞ්ගයෝද; හිමකරො, චන්ද්‍රයෝද, රවි, සූර්‍ය්‍යයෝද; බ්‍රහ්මරාජා, බ්‍රහ්මයෙමේද; නාගාදිකෙසු, නාගාදීන් අතුරෙහි; අයංහි, මෙතෙම වනාහි; අඤ්ඤතරොහි, එක්නරයෙකුනොක්දෝ; කොචි, කවරෙක්දෝහෝයි සියා; කොතූහලෙ, හටගත් කුතුහල්සින් ඇති; නගරවාසිකා; රජගහනුවරවාසීවූ; නෙකසත්තා, අනේකසත්වයන්; මඤ්චාවලෙන, මඤ්චාවලයෙන්; (හෙවත් මෙරමහින් අලලනලද) උදධිං විය, සාගරය සෙයින්; ලොලයිංසු, උල්ලොලනයකරවා.

63. සො, ඒ මහබෝසත්තෙම; පණ්ඩවචලස්ස ඡායාය, පණ්ඩවනම් පර්‍වතරාජයාගේ සෙවනට; ගතො, වැඩියසේක්; නිසජ්ජ, වැඩහිඳ; සපදානවසෙන, ගෙපිළිවලින් සිඟීම් වශයෙන්; නානාරසෙහි ලද්ධං, නොයෙක් රසයින් ලද්දාවූ; තං, ඒ මිශ්‍රකාහාරය; යොනිසො, සිහිනුවණින් යෙදී; පච්චවෙක්ඛණවසෙනච, ප්‍රත්‍යවේක්ෂා වශයෙන්; දෙවානං, දෙවියන්ගේ; දිබ්බවරභොජනකංව, උතුම්වූ දිව්‍යභොජනයක්මෙන්; භුත්වා, වළඳා.

64. ආගන්ත්වා බිම්බිසාරෙනාවනිපතිනරින්දෙන නාමඤ්ච ගොත්තං
සම්මා පුච්ඡිත්ව සුද්ධෝදනනරපතිනො ජෙට්ඨසූනුන්ති සුත්වා,
රජ්ජෙ නායාචිතොහං මගධපතිඛිලං චක්කවත්තිම්පි රජ්ජං
හිත්වා බුද්ධො භවෙය්‍යං මම තු මගධරජ්ජෙන නාලන්ති වත්වා.

65. පටික්ඛිප්ප කත්වා තමගහම්පි රජ්ජං
පධානාය ගච්ඡං පථෙ අන්තරම්හි,
පසිද්ධෙන ආළාරකෙනුද්දකෙන
ගරුට්ඨානතො යාචිතො බොධිසත්තො.

66. ආචරියට්ඨානම්පි තං නව සාදියිත්වා
නෙරඤ්ජරාය නදියා අවිදූරඨානෙ,
සාලද්දුමෙහි ඝණසාලවනෙ විසාලෙ
කත්වාන විරියපුරස්සර දුක්කරම්පි.

---

64. අවනිපති නරින්දෙන, පෘථිවීශ්වරනරෙන්ද්‍රවූ; බිම්බිසාරෙන, බිම්බිසාර නම් රාජොත්තමයා විසින්; ආගන්ත්වා, (එනනට) අවුත්; නාමඤ්චගොත්තං, නාමනා ගොත්‍රයද; සම්මාපුච්ඡිත්වා, මනාකොට විචාරා; සුද්ධොදනනරපති නො, සුද්ධොදනනම් නරොත්තමයාගේ; ජෙට්ඨසූනුන්ති සුත්වා, ජ්‍යෙෂ්ඨපුත්‍රවූ සිද්ධාර්ථකුමාරයායයි අසා සතුටුව; රජ්ජෙන, මගධරාජ්‍යයෙන්; ආයාචි තො, ආරාධනාකරනුලදයේන්; මගධපති, මගධෙශ්වරවූ රජ; අහං, මම; අඛිලං චක්කවත්තිරජ්ජම්පි හිත්වා, සියලු සක්විතිරාජ්‍යයද හැරපියා; බුද්ධොභවෙය්‍යං, බුදුවන්නෙමි; මම තු, මට වනාහි; මගධරජ්ජෙන, මග ධරාජ්‍යයෙන්; නාලන්තිවත්වා, ප්‍රයොජනනැතැයි කියා.

65. අගහං, උතුම්වූ; තං රජ්ජං අපි, ඒ (බිම්සරරජතුමිසින් දෙන්නට ආ රම්භකල) මගධරාජ්‍යයද; පටික්ඛිපං කත්වා, ප්‍රතික්ෂෙපකොට; පධානාය ගච්ඡං, වීර්‍ය්‍යප්‍රධානභූමියට යනසේක්; අන්තරම්හි පථෙ, අතරමාර්ගයෙහි; පසිද්ධෙන, ප්‍රසිද්ධවූ; ආළාරකෙන, (සප්තසමාපත්තිලාභිවූ) ආළාර තාපස යන් විසින්ද; උද්දකෙන, (ලොකාස්වාදමිශ්‍රය දුරුකොට අෂ්ටසමාපත්තිලා භිවූ) උද්දකනම් තාපසයා විසින්ද; ගරුට්ඨානතො, ආචාර්‍ය්‍යස්ථානයෙන්; යාචිතො, යාච්ඤාකරනුලද්දාවූ; බොධිසත්තො, මහබෝසත්තෙම.

66. තං ආචරියට්ඨානං අපි, ඒ ආචාර්‍ය්‍යස්ථානයද; නවසාදියිත්වා, නොඉවසා; නෙරඤ්ජරාය නදියා, නෙරඤ්ජරානම් ගඞ්ගාවට; අවිදූරෙ ඨානෙ, නුදුරු තැන්හි; (හෙවත් ඒ ගඞ්ගාතීරයෙහි) විසාලෙ, විශාලවූ; සාලද්දුමෙහි, ශාලද්‍රැමයන් විසින්; ඝන, එකඝනවූ; සාලවනෙ, සල්වනයෙහි; විරියපුර ස්සර, වීර්‍ය්‍යපූර්වඞ්ගමකොටඇති; දුක්කරම්පි කත්වාන, දුෂ්කරක්‍රියාදකොට

67. පුබ්බෙ තු කාපිලපුරෙ ඉව දෙවරාජා
කාමෙසු කාමසුඛඅල්ලිකආනුයොගා,
නිබ්බාණභාවමපි ලොකපකාසයිත්වා
දස්සෙත්ව ඊදිසකතොපි ඉදනභාවං.

68. අඩ්ඪිකාරියපථෙ පටිපජ්ජමානො
ආහාරපානපරිභොගවසෙනුදරෙ,
චත්තිංසලක්ඛණධරං තනුපීණයිත්වා
සම්පුණ්ණුපොසථදිනම්හි විසාඛමාසෙ.

69. තමං ධංසයිත්වා දිනිසුග්ගතම්හි
වටස්සාජපාලස්ස මූලස්ස ගන්ත්වා,
නිසින්නො ස තස්මිං සුජාතාය දින්නං
මධුක්ඛීරඅන්නං සපාතිං ගහෙත්වා.

---

67. පුබ්බෙතු, පූර්වයෙහි වනාහි; කාපිලපුරෙ, කපිලවස්තුපුරයෙහි; දෙවරාජාඉව, ශක්‍රදෙව්රජසෙයින්; කාමෙසු, රූපාදි පඤ්චකාමයන්හිහි; කාමසුඛඅල්ලිකආනුයොගා, කෙලශකාමසැපයාගේ යෙදීම් හේතුවෙන්; නිබ්බාණ අභාවම්පි, නිර්වාණයාගේ නොලැබීමද; ලොකස්සපකාසි ත්වා, ලොවට ප්‍රකාශකොට; ඉදානි, දැන්; ඊදිසකතොපි, මෙබඳු දුෂ්කරක්‍රියාවෙනුදු; අභාවං, නිර්වාණයාගේ අභාවය; දස්සෙත්වා, දක්වා;

68. උදරෙ, මහත්වූ; අඩ්ඪිකාරියපථෙ, අෂ්ටාඞ්ගිකායඛිමාර්ගයෙහි; පටිපජ්ජමානො, පිළිපදින්නේ; ආහාරපානපරිභොගවසෙන, ආහාර පානපරිභොග වශයෙන්; චත්තිංසලක්ඛණධරං, දෙතිස්ලකුණු දරූ වාවූ; තනුං පීණයිත්වා, ශරීරය පිණවාගෙණ; විසාඛමාසෙ, වෛශාඛ මාසයෙහිවූ; සම්පුණ්ණඋපොසථදිනම්හි, සම්පූර්ණවූ මැදි පොහෝ දින යෙහි.

69. තමං ධංසයිත්වා, අඳුරුනසා, දිනිසෙ, දිනෙන්ද්‍රයා; උග්ගතම්හි, උදාවූකල්හි; අජපාලස්සවටස්ස, අජපාලනම් න්‍යග්‍රොධයාගේ; මූලස්ස, මුල(සමීප)යට; ගන්ත්වා, ගොස්; තස්මිං, එහි; නිසින්නො, හුන්නාවූ; සො, ඒ බෝසත්තෙම; සපාතිං, රන්තලියහාසමග; සුජාතාය දින්නං, සුජාතා නම් සිටුදියණිය විසින් දෙනලද; මධුක්ඛීරඅන්නං, මිහිරිවූ කිරිබත; ගහෙ ත්වා, ගෙණ.

70. නදිං ගන්ත්වා නෙරඤ්ජරං වාලුකාය
ථපෙත්වාන පාතිං නහාත්වාන පච්ඡා,
කරිත්වාන එකූනපඤ්ඤාසපිණ්ඩෙ
සුභුත්වාන පාතිං වජ්ජුද්ධසොතං.

71. පමුදිතකුසුමානං ගන්ධතො ආගතානං
අලිකුලඅම්භිතානං නාදනිච්චාකුලානං,
සුරතරුසදිසානං නෙකසාලද්දුමානං
වන පවිසිය තස්මිං සො දිවාවාසකත්වා.

72. වස්සන්තාසු නිරන්තරංසු අමරබ්‍රහ්මාසුරින්දදිසු .
පාරිච්ඡත්තකපුප්ඵරත්තපදුමාදී දිබ්බපුප්ඵෙහිච,
වායන්තාස්වනිලෙසුදිස්සුවමුදූ මානුඤ්ඤ සොගන්ධිසු
කම්පන්තීසු වසුන්ධරාසු ච තථා සත්තුත්තමො නායකො.

---

70. නෙරඤ්ජරං නදිං ගන්ත්වා, නෙරඤ්ජරාහි ගංගාවටගොස්; වාලුකාය, වැල්ලෙහි; පාතිං ථපෙත්වාන, රන්තලිය තබා; නහාත්වාන, (ගංගාවටබැස) නහා; පච්ඡා, පසුව; එකූනපඤ්ඤාසපිණ්ඩකරිත්වා, එකුන්පනස්පිඩක්කොට; සුභුත්වාන, මනාකොට වළඳා; පාතිං, රන්තලිය; උද්ධසොතං වජ්ජිත්වා, උඩුගම්බලායෙවයි හැර.

71. පමුදිතකුසුමානං, ප්‍රමුදිතවූ කුසුමයන්ගේ; ගන්ධතො, සුගන්ධයෙන්; ආගතානං, ආවාවූ; අලිකුලඅම්භිතානං, අපමණවූ භෘඞ්ගසමූහයාගේ; නාදෙ, නාදයෙන්; නිච්චං, සතතයෙන්; .ආකුලානං, ගැවසිගත්තාවූ; සුරතරුසදිසානං, දිව්‍යවෘක්ෂවැනිවූ; නෙකසාලද්දුමානං, නොයෙක් ශාලද්‍රැමයන්ගෙන් සමන්විතවූ; වනං, වනයට; සො, ඒ මහසත්තෙම; පවිසිය, ප්‍රවිෂ්ටව; තස්මිං, එහි; දිවාවාසංකත්වා, දිවාවාසකොට.

72. අමරබ්‍රහ්මාසුරින්දදිසු, දිව්‍යබ්‍රහ්මඅසුරෙන්ද්‍රාදීන්; පාරිච්ඡත්තකපුප්ඵරත්තපදුමාදී, පරසතුමල් හා රත්පියුම් ආදිවූ; දිබ්බපුප්ඵෙහිච, දිව්‍යපුෂ්පයෙන්ද; නිරන්තරංසු, අතුරක්නැතිව; වස්සන්තාසු, වස්වනකල්හි; දිසසු, ඒ ඒ දික්හි; මුදු, මෘදුවූ; මානුඤ්ඤ, මනොඥවූ; සොගන්ධිසු, සුවඳවත්වූ; අනිලෙසු වායන්තාසු, මාරුතය හමනකල්හි; තථා, එසේම; වසුන්ධරාසු, (දසදහසක්සක්වලහැම) මහාපෘථිවීහු; කම්පන්තීසු, කම්පාවන කල්හි; සත්තුත්තමො, සත්වොත්තමවූ; නායකො, නායකතෙම.

73. අච්ඡුස්සසෙන පුථුලෙන සුසජ්ජිතෙන
දෙවාභිනිම්මිතමනොහරවර අජසෙන,
මත්තෙභකුම්භඵලදළනකෙසරී ගච්ඡං
සීහොව ගජ්ජමතුලං වර බොධිමණ්ඩං.

74. කප්පසහස්ස සතාමිතපුඤ්ඤං කත්වා සුපත්ථිත සොත්ථි විජෙතා,
විප්පවරෙනුපනීත කුසවෙග අඞ්ඝිතෙ තිණමුට්ඨි ගහෙත්වා.

75. සුද්ධසිනිද්ධසුවට්ටසුමට්ටං ඛන්ධමුජුං ඝන බද්ධමයූර,
පිඤ්ජසුනීලනිලාචලපත්තං චඤ්චලරත්තසුපල්ලවසොභං.

76. මන්දානිලසුවිකම්පිතසාඛං භූතිලකං සහජං සිතඛන්ධං,
සබ්බමුනිස්සරසෙවිතභූජං තෙන තරුං විජයාවහ පසිද්ධං.

---

73. පුථුලෙන, පළලින්; අච්ඡුස්සසෙන, අවඉස්ඛන්පමණැති; සුසජ්ජිතෙන, මනාවූ පැළඳුන්ඇති; දෙවාභිනිම්මිත, දෙවියන් විසින් නිර්මිතකරණ ලද; මනාවරඅජසෙන, උතුම්වූ මහාමාගීයෙන්; මත්තෙභ, මත්වූ ඇතුන්; කුම්භඵලදළනකසරී, කුම්භස්ථලවිදාරණය පිණිස; ගච්ඡං, පැළඹියන්නාවූ; සීහොව, කෙශරසිංහරාජයාකුමෙන්; අතුලං, අතුලවූ; වර, උතුම්වූ; බොධිමණ්ඩං, බෝමැඩකරා; ගච්ඡං, වඩනාසේක්.

74. කප්පසහස්සසත, කල්පලක්ෂයක් මුළුල්លෙහි; අමිතපුඤ්ඤං, අප්‍රමාණ කුසල්; කත්වා, කොට; සුපත්ථිත, (ඒනනතුර) මොනවට ප්‍රාර්ථනා කොට ආවාවූ; සොත්ථිවිජෙතා විප්පවරෙන, සොත්ථිවිජනාම් බමුණුතුමෙ කුවිසින්; උපනීත, එලවනලද; අඞ්ඝිතෙ, අවම්ටක්පමණවූ; තිණකුස වෙග, කුස තෘණයන්; ගහෙත්වා, පිළිගෙණ;

75. සුද්ධ, පිරිසිදුවූ; සිනිද්ධ, (කාන්තිමත්වනබැවින්) සිනිදුවූ; සුවට්ට, ඉතා වටවූ; සුමට්ටං, ඉතා මටවූ; ඛන්ධමුජුං, සෘජුවූ කඳඇති; ඝනබද්ධං, ඝනකොට බඳනාලද; මයූරපිඤ්ජ, මොණරපිල්කලඹක්සේ; සුනීල, සුනිලවූ; අනිලාචල, පවනින් චල්නවන; පත්තං, පත්‍රඇති; චංචල, චලිත වන; රත්තසුපල්ලවසොභං, (පබළුසේ) සුරක්ත පලුපහින් සොභාමත්වූ.

76. මන්දානිල, මන්දානිලයෙන්; සුවිකම්පිත, මොනවට කම්පාවන්නාවූ; සාඛං, සාඛා ඇති; භූතිලකං, පෘථිවියට තිලකාභරණයක් වැනිවූ; සහජං, නමත්වගත්සේ උපන් දවසේම උපන්නාවූ; සිතඛන්ධං, ධවලවූකඳ ඇති; සබ්බමුනිස්සරසෙවිතභූජං, සියළුසර්වඥයන්විසින් සෙවුනාලද භූමි යෙති ගටගත්නාවූ; තෙන, ඒ කාරණයා හෙතුකොටගෙණ; විජයාවහ පසිද්ධං නාමං, විජයාවහයයි ප්‍රසිද්ධවූ.

77. අනුද්දයා විය සීතල ඡායං තං වර බොධිතරුං සමුපෙච්ච;
වාරත්තයා ච පදක්ඛිණං කත්වා බුද්ධපදෙස විජානිය අග්ගං.

78. චාලෙත්වා තානි කුසනාමතිණානි තස්මිං
සම්මාකතෙන කුසලෙන චිරං තමත්ථං;
භූමිංපදාලිය තහිං පන උට්ඨිතස්මිං
චාතුද්දසෙ රතනකෙ වජිරාසනස්මිං.

79. භූමි අයම්ච නිඛිලා පරිවත්තයන්තෙ
නෙකෙසහස්සඅසනී පි ච වත්තයන්තෙ,
ඵාලෙන්තකෙ ගගණගජ්ජිතසුක්ඛතොපි
අන්ධකාරවස්සනිකරෙ පි ච වත්තයන්තෙ.

80. තචං මංස අට්ඨිං නහාරුං ච මය්හං
තථා ලොහිතං චෙව විසුස්සන්තකෙපි
අපත්වාන බොධිං ඉතො වුට්ඨහිත්වා
නාගච්ඡාමි ධිට්ඨාන කත්වා නිසීදි.

---

77. අනුද්දයා විය, භාග්‍යවත්වහන්සේගේ කරුණාවසයෙන්; සීතලඡායං, සිහිල් සෙවනඇති; තං වරබොධිතරුං, ඒ උතුම් බොධිරාජයාකරා; සමුපෙච්ච, එළඹ; වාරතයා, වාරත්‍රයක්; පදක්ඛිණං කත්වා, පැදකුණුකොට; අග්ගං, උතුම්වූ; බුද්ධපදෙසං, බුද්ධප්‍රදේශය (හෙවත් සියළු සර්වඥයන් විසින්) අවිජහිතස්ථානය; විජානිය, විශෙෂයෙන් දැන.

78. තස්මිං, ඒ භූමිප්‍රදෙශයෙහි; තානි කුසනාමතිණානි, ඒ කුසසඞ්ඛ්‍යාත තෘණයන්; චාලෙත්වා, සලාවගුරුවා; තමත්ථං, ඒ(ආසනය)පිණිස; චිරං, බොහෝකලක් මුළුල්ලෙහි; සම්මාකතෙන කුසලෙන, මනාකොට කරණලද කුසලබලයෙන්; තහිං පන, එහිවනාහි; භූමිං පදාලිය, භූමිප්‍රදාලනයකොට; උට්ඨිතස්මිං, පැනනැඟගාවූ; චාතුද්දසෙරතනකෙ, තුදුස්රියනක් උසඇති; වජිරාසනස්මිං, වජ්‍රාසනයෙහි.

79. අයම නිඛිලා භූමි, මේ සියළු පෘථිවි නොමෝද; පරිවත්තයන්තෙ, පෙරලෙනකල්හි; නෙකසහස්ස, නොයෙක් දහස්ගණන්; අසනී පි ච වත්තයන්තෙ, සෙනපටන්නාකල්හිද; ගගණ, ආකාශය; සුක්ඛගජ්ජිතො, ශුෂ්කගර්ජනාවෙන්; ඵාලෙන්තකෙ පි, පැළෙනකල්හිද; අන්ධකාරවස්සනිකරෙ, තිමිරඝූරු වර්ෂාසමූහය; වත්තායන්තෙපි ච, පවත්නාකල්හිද.

80. මය්හං, මාගේ; තචං, සමද; මංසං, මස්ද; අට්ඨිං, ඇටද; නහාරුං ච, නහරද; තථා, එසේම; මේ, මාගේ; ලොහිතංච, ලේද; (යනමේ සියල්ල) විසුස්සන්තකෙපි, වියලියනකල්හිද; බොධිං අපත්වාන, සර්වඥබොධියට නොපැමිණ; ඉතොවුට්ඨහිත්වා, මේ අස්නෙන් නැඟිට; නාගච්ඡාමි, නොයම්සිසියා; අධිට්ඨානං කත්වා, අධිෂ්ඨානකොට; නිසීදි, (වජ්‍රාසනාරූඪව) වැඩඋන්සේක.

81. අථ සුරපතිසක්කො ඨාසි සඞ්ඛං ධමෙන්තො,
අකරි මධුරවීනානාද පඤ්චසිඛොපි,
සසුරවර සුයාමො චාමරං චාලයී සො
සිරසි අධරි ඡත්තං බ්‍රහ්මරාජාපි තස්ස.

82. සන්තුසිතොපි අවලි මණි තාලවණ්ටං
සාහස්සිනිම්මිතනාගවධූ ගහෙත්වා,
කාළොපි සො ඵණිවරො ථුතිගීයමානො
අට්ඨාසි තස්ස වරබොධිගවෙසකස්ස.

83. තාවතිංසකා සුරවරා ච තථා වධූනි
අට්ඨංසු දිබ්බමය පුප්ඵකරණ්ඩහත්ථා,
දෙවිස්සරා දසසහස්ස පි චක්කවාළා
සබ්බෙව තෙ ජනකවෙසධරා සමන්තා.

---

81. අථ, ඉක්බිත්තෙන්; සක්කො සුරපති, ශක්‍රදිව්‍යරාජතෙම; සඞ්ඛං ධමෙන්තො, (ශුචිනොදරයෙහි වාතපූර ධ්වනිඇති එක්සියවිසිරියන් පමණ තිබිජයුත්තරනම්) සංඛය පිඹිමින්; ඨාසි, සිටියේය; පඤ්චසිඛොපි, පඤ්චසිඛ නම් දිව්‍යරාජයාද; මධුර, මිහිරිවූ; වීනානාදං අකරි, (තුන්ගව්වක්පමණ දිගඇති බේළුවපාණ්ඩු වීනාවගෙණ) වීනාගායනාකිරීමෙන් නාදපැවැත්වීය; සො සුයාමොච, ඒ සුයාමනම් දිව්‍යරාජයාද; චාමරං, (තුන්ගව්වක් දිගඇති ශරත්කාලයෙහි සඳරැස්කලඹක්සේ සශ්‍රීකවූ) චාමරය; චාලයී, මදින්මද සැලීය; බ්‍රහ්මරාජාපි, සහම්පතිමහාබ්‍රහ්මරාජයාද; ඡත්තං, (තුන් යොදුනක් පුලුලැති දෙවෙනි පුන්සඳමඬලක් වැනිවූ) සෙව්තච්ඡත්‍රය; තස්සසිරසි, ඒ මහබෝසතුන්ගේ මස්තකයෙහි; අධරි, දැරී.

82. සන්තුසිතොපි, සන්තුසිතනම් දිව්‍ය රාජතෙමේද; මණිතාලවණ්ටං අවලි, මැණික් තල්වැටක්ගෙණ (සැපවූ මාරුතපරම්පරාවෙන් පිණවමින්) සැලීය; කාළොපි සො ඵණිවරො, ඒ කාලනම්නාරජද; අභිනිසහස්සනිම්මිත නාගවධූ, අසූදහසක්පමණ නාගනාටිකාවන්; ගහෙත්වා, ගෙණ; වරබොධිගවෙසකස්ස, උතුම්වූ සම්‍යක්සම්බොධිය ගවෙසනායකරන්නාවූ; තස්ස, ඒ මහාපුරුෂයානන්ට; ථුතිගීයමානො, ස්තුතිගායනාකරමින්; අට්ඨාසි, සිටියේය.

83. තථා, එසේම; තාවතිංසකාසුරවරාච, තෙතිස් දිව්‍යරාජයෝද; වධූනි, තෙතිස් දිව්‍යාඞ්ගනාවන්සමග; දිබ්බමයපුප්ඵකරණ්ඩහත්ථා, දිව්‍යමය මල්පිරූ කරඬුගත් අත්ඇත්තාහු; අට්ඨංසු, සැදීසිටියාහුය; දසසහස්ස චක්කවාළාපි, දසදහසක්සක්වළ වාසීවූ; සබ්බෙව තෙ දෙවිස්සරා, ඒ සියලු දිව්‍ය රාජයෝ; ජනකවෙසධරා, ගණකවෙස් ගත්තාහු; සමන්තා, හාත්පසින් සිටියාහුය.

84. ධජගහිතකරාපි කාදලිතොරනාපී
ගහිත කුසුමදාමා ධූමකාටච්ඡුකාපි,
ගහිතමණිමයද්දණ්ඩබ්‍යදීපාතථෙ'ව
කරගහිතවතුමෙ මඞ්ගලාදී අනෙකා.

85. පූජේනෙත ඉති බ්‍රහ්මදෙවනිකරෙ ආබ්‍රහ්මලොකා තද
මාරො සො වසවත්තිකො කතවසො පොථුජ්ජනෙ ලොකිකෙ,
සො සිද්ධත්ථකුමාරකො විසය මෙ ආතික්කමා මඤ්ඤති
කාමං තං නච අත්ථසාධකකරං කාරෙමසිද්ධත්ථකං.

86. ඉච්චෙවං චින්ත්‍යා බාහු දසසතපමිතෙ මාපයිත්වා මහන්තෙ
ඛග්ගං සත්තිඤ්ච කුන්තං කණයපභුතිකෙ සායුධෙ පජ්ජලන්තෙ,
පඤ්ඤාසං යොජනානං දසදසකමිතං යොජනුච්චං මහන්තං
චණ්ඩං ආරුය්හ මාරො ගිරි ඉති විස්සුතං මෙඛලං තං ගජින්දං.

---

84. ධජගහිතකරාපි, ධජපතාකගත් අත්ඇත්තාවූද; කාදලිතොරනාපි, කෙසෙල්තොරන්ගත් අත්ඇත්තාවූද; ගහිතකුසුමදාමා, ගත්තාලදමල්දම් ඇත්තාවූද; ධූමකාටච්ඡුකාපි, දුම්කසුඇත්තාවූද; ගහිත, ගත්තාලද; මණිමයදණ්ඩබ්‍යදීපා, මිණිමුවා දඬුවැටපහන් ඇත්තාවූද; තථෙව, එපරිද්දෙන්ම; කරගහිත, අතින්ගත්තාලද; වතුවෙමඞ්ගලාදිඅනෙකා, අෂ්ටමඞ්ගලනදී අනෙක පූජාභාණ්ඩයන් ඇත්තාහු.

85. ඉති, මෙසේ; (ඝටොපාකාරප්‍රකාරයෙන්) බ්‍රහ්මදෙවනිකරෙ, බ්‍රහ්මයන්නා දිව්‍යසමූහයෝ; ආබ්‍රහ්මලොකා, බ්‍රහ්මලොකයදක්වා; පූජෙනත, පුදනාකල්හි; පොථුජ්ජනෙ, පෘථග්ජනවූ; ලොකිකෙ, ලෞකිකසත්වයන්; කතවසො, වසඟකළාවූ; වසවත්තිකො, (එහෙයින් ලද) වසවර්තීනම් ඇති; සො මාරො, ඒ මාරදිව්‍යපුත්‍රතෙම; සො සිද්ධත්ථකුමාරකො, ඒ සිදුහත්කුමාරතෙම; මෙ විසය, මාගේ විෂය; ආතික්කාමාමඤ්ඤති, ඉක්මවීයයි සිතන්නේය; කාමං, එකාන්තයෙන්; තං, ඒසිද්ධාර්ථකුමාරයා; නච අත්ථසාධකකරං, අර්ථසිද්ධනොකරන්නාවූ; අසිද්ධත්ථකං කරෙමි, අසිද්ධාර්ථයාකරමි; (මෙසේ සාහසිකව)

86. මාරෙ, මාරදිව්‍යපුත්‍රතෙම; ඉච්චෙවං චින්ත්‍යා, මෙසේ සාහසිකවූ බස්කියා; ඛග්ගං, කඩුවය; සත්තිං, සත්ගිය; කුන්තං, කොන්තායුධය; කණයපභුතිකෙ, කණයායුධයආදීවූ; පජ්ජලන්තෙ, ගිනිගෙණ දිලිහෙන්නාවූ; සායුධෙ, (මේසෙක්කියනලද) ආයුධ සහිතාවූ; මහන්තෙ, මහත්වූ; දසසතපමිතෙ, දහසක්පමණ; බාහුමාපයිත්වා, අත්මවාගෙණ; යොජනානං, යොදුන්සම්බන්ධිවූ; පඤ්ඤාසං, පණසක්; (අධිකකොට ඇති) දසදසකමිතං යොජනුච්චං, සියයක් යොදුන් උසඇති; (හෙවත් සෙලසියයක් යොදුන් උසඇති) චණ්ඩං, චණ්ඩවූ; ගිරිමෙඛලං ඉති, ගිරිමෙඛලායයි; විස්සුතං, ප්‍රකටවූ; මහන්තං, මහත්වූ; තං ගජින්දං, ඒ හස්තිරාජයාට; ආරුය්හ, නැඟ.

87. සීහබ්‍යග්ඝාදිවණ්ණං අමිතවිධමුඛං තම්බජාලග්ගිකෙසං
රත්තං නික්ඛන්තනෙත්තං භයජනකමුඛං පිණ්ඩොට්ඨගත්තං,
සප්පාලඞ්කාරධාරං කරගහිතමිතං ආයුධං පජ්ජලන්තං
නික්ඛන්තං භූරිදන්තං අඛිලතනුමුඛං අග්ගිජාලං මහන්තං.

88. කප්පග්ගිපජ්ජලන්තං භයජනකරඟං මාරසෙනං ගහෙත්වා
සංවට්ටෙ මෙඝමාලා අමිතඝටනතො ජාතචණ්ඩාසනීනං,
කාලො සාහස්සලක්ඛං පතනරිවරතිදාරුණාඝොරසද්දා,
සාවෙසෙන්තා බ්‍රහ්මදෙවෙ සකලජගතිකං එකනින්නාදකත්වා.

89. ගණ්හාථ සිද්ධත්ථකුමාරකං අමුං
මාරෙථ විජ්ඣථ ගහෙත්වා පාදෙ,
පාරං ඛිපෙථාති සමුද්දතොවං
ආණං මහන්තං අකරි පජාපති

---

87. සීහබ්‍යග්ඝාදිවණ්ණං, සිංහව්‍යාඝ්‍රාදීන්ගේ පාටගත්ඇති; අමිතවිධමුඛං, අප්‍රමාණවූ ආකාර මුහුණුඇති; තම්බජාලග්ගිකෙසං, ගින්නෙන්ඇවිලියාසේ තඹවන් කෙස්ඇති; නික්ඛන්ත, පිටතට නික්මියාවූ; රත්තංනෙත්තං, රත්වූ නෙත්ඇති; පිණ්ඩොට්ඨගත්තං, පිටතොල්වහන්නාවූ (නොහොත් පිටුතොලකන්නාවූ) භයජනකමුඛං, භයඞ්කාරවූ මුහුණුඇති; සප්පාලඞ්කාරධාරං, දරණලද සර්පාලඞ්කාරඇති; කරගහිත, හස්තයෙන් ගන්නාලද; පජ්ජලන්තං, ගිනිගෙණ දිල්හෙන්නාවූ; අමිතං ආයුධං, අප්‍රමාණ ආයුධඇති; නික්ඛන්තං, පිටතට නික්මුනාවූ; භූරිදන්තං, මහත් දත්ඇති; අඛිලතනුමුඛං, සියළු ශරීරයෙන්හා මුඛයෙන් නික්මුනු; මහන්තං අග්ගිජාලං, මහත් ගිනිදූල්ඇති.

88. කප්පග්ගිපජ්ජලන්තං, කල්පාන්තවහ්නියක්සේ දිලිහෙන්නාවූ; භයජනකරඟං, භයජනකාකීවූ; මාරසෙනං, මරසෙනග; ගහෙත්වා, ගෙණ; සංවට්ටෙ, යුගාන්තයෙහි; අමිතමෙඝමාලාඝටනතො, අප්‍රමාණ මෙඝමාලාවන්ගේ ඝට්ටනයෙන්; ජාතං, හටගත්තාවූ; චණ්ඩාසනීනං, දැඩි හෙනකම්පාවූ; සාහස්සලක්ඛපතනකාලො ඉව, දහසක්ලක්ෂයක්හෙනස් පතනයවනකලක්මෙන්; අතිදාරුණං, ඉතා දරුණුවූ; ඝොරසද්දා, ඝොර ශබ්දයෝ; බ්‍රහ්මදෙවෙ, දෙව්බඹුන්; සාවෙසෙන්තා, අස්වමින්; සකලජගතිකං, සියළු භුවනත්‍රය; එකනින්නාදකත්වා, එකනින්නාදකොට.

89. පජාපති, මාරතෙම; අමුං සිද්ධත්ථකුමාරකං, අර සිද්ධාර්ථකුමාරයා; ගණ්හාථ, ගණුව; මාරෙථ, මරව; විජ්ඣථ, විදුව; පාදෙ ගහෙත්වා, කකුල්ගෙණ; සමුද්දතො පරං, සමුද්‍රයෙන් එපිට; ඛිපෙථාති, දමවයයි; එවං, මෙලෙස්; මහන්තං, මහත්වූ; ආණං අකරි, අඬගසන් කළේය.

90. කප්පානිලා පිචුමිවස්සහදස්සනෙන
පාලාපයං නිඛිලදෙවගණෙ ච බ්‍රහ්මෙ,
සාමන්තපබ්බතඝටා විය මද්දයන්තා
ගම්භීර ධීරතරමෙදිනියාපකම්පා.

91. නිම්මාය වාතමපිතෙන ච චීවරස්මිං
චාලෙතුමස්සඅපහො අපිකණ්ණමත්තං,
වස්සොඝ චාපි පලයෙ ඉව චණ්ඩවස්සං
බින්දුම තෙන න ගතෙ පන සන්තිකම්පි.

92. නික්ඛන්තඅග්ගිසිඛා පුලිඞ්ගනිකරා සඤ්ජනිතා ආලිඞ්ගිතෙ
අග්ගිජාල මහන්තකෙ භයඞ්කරෙ පාසාණවස්සායුධෙ,
අඞ්ගාරෙපි ච උණ්හභස්මකලලෙ වස්සෙසුපි වාලුකෙ
පුප්ඵභාවගතෙ ච තෙ ඝනතරං මාපෙසි අන්ධං තථා.

---

90. කප්පානිලා, කල්පාන්ත වාතයෙන්; පිචුම්ව, ගසාදමනලද පුළුන් රැළමෙන්; නිඛිලදෙවගණෙච, (මහබෝමැඩවට පුදනගණසිටි) සියළු දිව්‍ය සමූහයාද; බ්‍රහ්මෙ, බ්‍රහ්මසමූහයාද; සහදස්සනෙන, තමාගේ දැකීමහා සමග; පලාපයං, ඉස ඒ ඒ අත පලවන්නේ; සාමන්ත, හාත්පසින්; පබ්බතඝටාවිය, පර්වතඝටනයෙන්මෙන්(හෙවත් පර්වතයකින් මඩනාකලක් මෙන්; මෙදිනියා, පෘථිවියෙහි; මද්දයන්තං, මඩනාවූ; ගම්භීර, ගැඹුරුවූ; ධීරතරං, ධීරතරවූ; පකම්පං, දැඩිවූ ආරම්භඇතිහෙයින් ප්‍රකම්පවූ.

91. වාතම්පි නිම්මාය, කියනලද ප්‍රකාරඇති වාතයකුදු මවා; අස්ස, ඒ මුනිවරයාණන්වහන්සේගේ චීවරස්මිං, චීවරයෙහි; කණ්ණමත්තං අපි, කොනක් පමණකුදු; චාලෙතුං, සොලවන්නට, අපහො, නොපොහොසත්වූයේ; පලයෙඉව, යුගාන්තයෙහිමෙන්, චණ්ඩවස්සංඅපි වස්සොඝා, ප්‍රචණ්ඩ වර්ෂාවකුදුවස්වා; තෙන, එයින්; බින්දුම, පොදබිඳුවකුදු; සන්තිකම්පි, සමීපයට; නගතෙ පන, නොගියකල්හි.

92. නික්ඛන්තඅග්ගිසිඛා, හාත්පසින් නික්මෙනා අග්නිසිඛාසමූහයෙහි; පුලිඞ්ගනිකර, ගිනිපුපුරු සමූහයෙන්; සංජනිතං, ගැවසිගත්තාවූ; අග්ගිජාලා, වහ්නිජ්වාලයෙන්; ආලිඞ්ගිතෙ, වැළඳනාලද; භයංකරෙ, භයකර වූ; මහන්තකෙ, මහත්වූ; පාසාණවස්සං, ගල් වර්ෂාවන්ද; තථා, එසේම; ආයුධෙ, ආයුධ වර්ෂාවන්ද; අඞ්ගාරෙපි ච, අඟුරු වර්ෂාවන්ද; උණ්හභස්ම, උනුඅළු වර්ෂාවන්ද; කලලෙපි ච, කලලවර්ෂාවන්ද; වාලුකෙ, වැලිවර්ෂාවන්ද; වස්සෙසු, වස්වා; තෙ ච, ඒ සියල්ලන්; පුප්ඵභාවගතෙ, පුෂ්පබවටගියකල්හි; ඝනතරං, (ලොකාන්තරික නරකයෙහි අඳුරක්මෙන්) ඝනතරවූ; අන්ධං මාපෙසි, අන්ධකාරයක් මැව්වා.

93. ආලොකං තෙන දිස්වා භයජනකධරං දාරුණං වෙස ඝොරං
මෙරුං මන්දාරකාදි ධරනිධර අපි ඡින්දිතුං සක්කිභූතං,
දිබ්බානුභාවූපෙතං අතිතික්ඛනතරං ධාරයුත්තං ඛුරග්ගං
චක්කාවහං ආයුධම්පි ඨපිය සිරසි තං ඡත්තභූතම්පි දිස්වා.

94. ඨිතෙන මාරෙහි දිත්තෙන ධරනිධරම්හෙ පුප්ඵභූතෙ ච දිස්වා
සො සොකෙනාභිභූතො අපටිහතයසං බොධිසත්තං උපෙච්ච,
සිද්ධත්ථාගච්ඡ මය්හං වජිරඝනි අමුං ආසනං පාපුණාති
නිස්සා යෙතංතු වත්වා කුසලපරිචිතෙ සක්ඛි කො තෙහි වුත්තො.

95. එතෙ සක්ඛිනිවත්තා සකපරිස කථා පෙත්ව මාරෙහි සක්ඛිං
පුච්ඡිත්වා සක්ඛී කො තෙ ඉති තව ඉධ මෙ පාණිභූතොහි තෙන,
භූමිං කත්වාන හත්ථං පවලිය විජ්ජා බොධිසම්භාරකාලෙ
කිත්තූ හි අත්ථදානි අචල අවනියා සක්ඛිවාචාපිතොපි.

---

93. තෙන, ඒ අන්ධකාරයෙනුදු; ආලොකං දිස්වා, (හිරුදහස් නැග්ගලක්ෂමත් මහාපුරුෂයාගේ ශරීරයෙන් නික්මුනාවූ) ආලොකය දැක; දාරුණං, දරුණුවූ; ඝොරං, ඝොරවූ; භයජනකධරං, භයජනක වෙශධාරිවූයේ; මෙරුං මන්දාරකාදී, මේරු මන්දාරාදිවූ; ධරනිධර අපි, පර්වතයෝ පවා; ඡින්දිතුං, (හුණකිලිලයේ) කපන්නට; සක්කිභූතං, හැකිවූ; දිබ්බානුභාවූපෙතං, දිව්‍යානුභාවයෙන් උපලක්ෂිතවූ; අතිතික්ඛනතරං, ඉතා තීක්ෂණවූ, ඛුරග්ගං ධාරයුත්තං, කරමුවහත්ඇති; චක්කාවහංආයුධම්පි, චක්‍රායුධයද; ඨපිය, දමානසා; තම්පි, ඒ චක්‍රායුධයද; සිරසි, මහබෝසතානන්ගේ මස්තකයෙහි; ඡත්තභූතං දිස්වා, ඡත්‍රයක්ව සිටියා දැක.

94. මාරෙහි, (තමාගේ) මාරයේනාව විසින්; ඨිතෙන, දමාගෙනලද; දිත්තෙන, ගිනිගෙණ දිලියෙහත්නාවූ; ධරනිධරඅම්හෙ ච, මාරානුභාවයෙන්යුක්තාවූ අපමණ පර්වතකූටයන්ද; පුප්ඵභූතෙ දිස්වා, මල්වූවා දැක; සො, ඒ මාරතෙම; සොකෙනාභිභූතො, ශොකයෙන් අභිභූත වූයේ; අපටිහතයසං, නොනස්නාලද යසස්ඇති; බොධිසත්තං උපෙච්ච, බොධිසත්වයන්කරා එළඹ; සිද්ධත්ථ, සිද්ධාර්ථකුමාරය; වජිර ඝනි, වජ්‍රාබන්නවූ; අමුං ආසනං, මේ ආසනය; (හෙවත්) නොපැළුන් නෙල වජ්‍රාසනය) මය්හං පාපුණාති, මට පැමිණෙන්නේය එහෙයින්; ගච්ඡ, අස්නෙන් නැඟීයවයි, වත්වා, කියා; එනංතුනිස්සාය, මේවජ්‍රාසනය නිසා වනාහි; කුසලපරිචිතෙ, කුසල්රැස්කිරීමෙහි; තෙ, තට; කො සක්ඛිභූතො, කවරෙක් සාක්ෂිදැයි කියනලද්දේ

96. පුබ්බෙ පුරෙ සකවසඞ්කාරවම්වුදරො
අනන්තනාමන්තඅවසංකර භූනිදන්,
ධාවන්තනෙකග් සකමාරබලෙග් සඞ්ඛං
වක්කාවභයා වලපි යාව පලාසි භීමො.

97. මාරංපිවූනපලයානිල බොධිසත්තො
ආදිච්චභානුගමනස්ස පුරෙ තරෙ ච,
මාරංසසෙන විධමෙත්ව තහිං නිසින්නො
ආගන්ත්ව බ්‍රහ්මඅමරාදිහි පූජයන්තො.

---

95. එතෙ සත්තිහි වත්වා, මොහිතු සාක්ඛියයි (මාරසේනාවට අනදිගු කොට) කියා; සකපරිස, තමාගේ පිරිසවූ; මාරෙහි, මාරසේනාවලවා; සක්ඛිං කාරාපෙත්වා, (පුලසාදක්ෂණෝපාව පරදවන මහත් ඝොරහඬින් මම සාක්ෂිය මම සාක්ෂියයි) සාක්ෂිකියවා; (නැවත) කො එත සක්ඛි ඉති පුච්ඡිත්වා,(සිඩාර්ථකුමාරයෙන්) තොපට කවරෙක් සාක්ෂිදැයි මෙසේ විචාරා; එතන, ඒ මහාපුරුෂයාණන් විසින්; ඉධ, මේනැත්හි; මෙ, මට; නව පාණි භූතොානි; සචෙතනිකසෙකනෙක් සාක්ෂිකියන්ට නැනැසිකියා; භාවීං භූමිංකත්වාන,(රත්වලාගැකිත්නික්මුනුරන්මිදුල්යක්මෙන් විටරගතියෙන්) දක්ෂිණහස්තයගෙණ භූමියට අභිමුඛකොට; බොධිසම්භාරකාලෙ, බොධිසම්භාරය පූරණකල්හි; විම්බාපවලිය, අනේකප්‍රකාරයෙන් ප්‍රවලිතවිය; දැනි, දූත්; ඝිනිතුන් අවම අණි, කුමක්හෙයින් නිශ්ශබ්දවූවාදැයි කියා; අවනිසා, (නොයෙක් දහස්ගණන් වාරයෙහි ගර්ජනාසඞ්ඛ්‍යාත ධ්වනිපැවැත්වූ) මහාපෘථිවියලවා; ඉති, මෙසේ මෙයින්; සක්ඛිවාචාපිතො, සාක්ෂිකියවනුලබන්නේ.

96. පුබ්බ, පූර්වයෙහි; පරෙ, සෙස්ස; සකවසඞ්ඛාරෙ, තමාගේ වසග යට පමුණුවාගත්තාවූ; භීමො, භයඞ්කරවූ; උදාරමමවවු, උදාරවූ වසවත් මරුතෙම; ඉදානි, දූත්; (තෙවත් බෝමැඩ මේ සංග්‍රාමයෙහි; අනන්තානං, තමාපමණකුදු; අනන්තඅවසඞ්කාරභූතො, තමාගේ වසගතවයට පමුණුවා ගන්නට අසමර්ථවූයේ; ධාවන්තනෙකග්ගි, (හයින් ත්‍රාසවූ ඉසලුලූදිශාවෙහි) දුවන; සකමාරබලෙහි; තමාගේ මාරසේනාව හා (ගතනාලද ආයුධ වාහනාභරණාදියදමා;) වක්කාවභයාවලා, වක්‍රවාට පර්වතය; යාවාපි, යම් තාක්ද ඒතාක් (හෙවත් සක්වලගලදක්වා) පලායී, පැරදීගියේයි.

97. මාරංපිවූන, මාරසේනාව නමැති පුළුනට; පලයානිල, ප්‍රලයාග්නිලයක්වැනිවූ; (හෙවත් කල්පාන්ත වාතයක්වැනිවූ) බොධිසත්තො, මහබෝසත්තෙම; ආදිච්චභානුගමනස්ස පුරෙ තරෙව, හිරු අස්තයට යන්ට පූර්වභාගයෙහිම; ස්සසනමාරං, සේනාව සහිතවූ වසවර්තිමාරයා; විධමෙත්වා, විධ්වංසනයකොට; තහිං නිසින්නො, එහි වැඩඋන්නේක්; බ්‍රහ්ම අමරාදීහි; බ්‍රහ්ම අමර නාග සුපර්ණාදීන් විසින්, ආගන්ත්වා, එතැනට රැස්ව අවුත්; පූජයන්තො,(ජයොග්ගිඛස්ස සිර්මතො ඝනාදීන් ජයඝොෂා පවත්වමින්) අධිකතරව පුදනුලබන්නේක්.

98. පුබ්බෙනිවාසං පන ඤාණ සෙට්ඨං
යාමම්හි පුබ්බෙ සමනුස්සරිත්වා
මජ්ඣිමම්හි යාමෙ වර දිබ්බචක්ඛු
ඤාණං ලභිත්වාපරඅන්තයාමෙ.

99. ආදිං කත්වානවිජ්ජං අපරමරණකං අන්තකත්වානුදාරං
ගම්භීරාපාරගාධං අතිනිපුණවරංපච්චයාකාරධම්මං,
සාමුද්දං ඤාණමන්ථාචලමථනවසා සම්මසන්තො විසෙසා
වෙසාරජ්ජාදි සද්ධිං ලභිය අමතකං අග්ගසබ්බඤ්ඤුතඤ්ඤාණං.

100. සම්මාවිජෙත්වා සහවාසන ආසවෙති
ඤෙය්‍යාඛිලං කරතලාමලකං ච ඤත්වා,
සම්පුණ්ණසුන්දරමනොරථකො මුනින්දො
වත්තෙසි පීතිවචනම්පි අකාරමාදී.

---

98. පුබ්බෙ යාමම්හි පන, පෙරයම වනාහි; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨවූ; පුබ්බෙනි වාසං ඤාණං, පෙරවිසූ ස්කන්ධපරිපාටිය සිහිකරන්නාවූ ඤාණය; සමනු ස්සරිත්වා, අනුස්මරණයකොට (හෙවත්) පෙරයම පූර්වෙනිවාසානුස්මෘති ඥණය ලබා; මජ්ඣිමම්හි යාමෙ, මධ්‍යම යාමයෙහි; වරං, උතුම්වූ; දිබ්බ චක්ඛුඤාණං ලභිත්වා, දිව්‍යංචක්ෂුරභිඥණය ලැබ; අපරං, අන්‍යවූ; අන්තයා මෙ, පශ්චිමයාමයෙහි.

99. අවිජ්ජං, (චතුස්සත්‍ය ප්‍රතිච්ඡාදකවූ) අවිද්‍යාව; ආදිං කත්වාන, ආදි කොට; අපර, අන්‍යවූ; මරණකං, මරණය; අන්තං කත්වාන, කෙළවර කොටඇති; උදාරං, උදාරවූ; ගම්භීරං, අතිගම්භීරවූ; අපාර, පරතෙරට නොපැමිණියහැක්කාවූ; අගාධං, ගැඹුරෙහි යටකෙළවර පිහිටක් ලබන්නටනොහැකිවූ; අතිනිපුනං, (සියක්වරපැළූ අශ්ලොම් අගින්සේසොයන්නට) ඉතාසූක්ෂමවූ; වරං, උතුම්වූ; පච්චයාකාරධම්මං, ප්‍රතීත්‍යසමුත්පාද ධර්ම නමැති; ඤාණමන්ථාචලා, අනාවරණඥාණ නමැති මන්ථාචලයෙන්; මථනවසා, මථනයකිරීම්වශයෙන්; විසෙසාසම්මසන්තො, විශෙෂයෙන් සම්මර්ශනයකරණසේක්; වෙසාරජ්ජාදිසද්ධිං, චතුර්වෛශාරද්‍යාදී (අනන්ත ගුණරත්නයන්හාසමග;) අග්ගං, අග්‍රවූ; සබ්බඤ්ඤුතඤ්ඤාණඅමතකං, සර්වඥ තාඥාණ නමැති අමෘතය; ලභිය, ලැබ.

100. සහවාසන, වාසනාදොෂයන් සහිතවූ; ආසවෙති, කාමාදී ආශ්‍රවයන්ගෙන් සම්මාවිජෙත්වා, මොනවටජයගෙණ; අඛිලංඤෙය්‍යං, සියළු පංචවිධ ඥෙය්‍යමණ්ඩලයද; කරතල, හස්තතලයෙහිතුබූ; ආමලකංවඤත්වා, ජොහිරංගමාණික්‍යයක්සේ නිරවශෙෂකොට දැන; සම්පුණ්ණං, සම්පූර්ණවූ; සුන්දරමනොරථකො, උතුම්වූ මනොරථඇති; මුනින්දො, මුනීන්ද්‍රවූ සර්වඥතෙම; අකාරමාදී, අකාරය ආදිකොටඇති (හෙවත් අනෙකජාති සංසාරංය නාදිවූ) පීතිවචනම්පිවත්තෙසි, ප්‍රීතිවාක්‍යද පවත්වාවදාළසේක.

101. බුද්ධම්හා ලොකනාථො තිභුවනමහිතො අග්ගදීපඞ්කරම්හා
ලද්ධො යො සබ්බ වෙය්‍යාකරණමතුලකං බොධිසම්භාරධම්මෙ,
පූරෙත්වා බොධිමූලෙ ඉති තික්ඛිණබලෙ පංචමාරෙවිජෙත්වා
බුද්ධො තං ධම්මරාජං සුරනරමහිතං මුද්ධනාහං නමාමි.

102. සත්ථුස්සාදිච්චවංසස්සතිවිපුලගුණස්සත්ථඤ්ඤුණස්ස ඤෙය්‍යා
ගාථානං ධම්මරඤ්ඤො දසදසකමිතා වණ්ණිතං මෙ ගුණං යං,
පුඤ්ඤෙනෙතෙන හන්ත්වා අඝතම සුචිරං ඨාතු සද්ධම්මදීපො
රාජා පාලෙන්තු ධම්මෙනඝී අගමකා සාසනඤ්චෙව ලොකං.

---

101. සො, යම් බුද්ධරාජයෙක්තෙම; ලොකනාථො, ලොකනාථවූ; තිභුවනමහිතො, තුන්ලෝවාසීන්විසින් පුදනලද්දාවූ; අග්ගදීපඞ්කරම්හා, ශ්‍රෙෂ්ඨදීපඞ්කරබුදුවූ; බුද්ධම්හා, සර්‍වඥයන්කෙරෙන්; (හෙවත්) දීපඞ්කරනම් බුදුන්ගෙන්; අතුලකං, අතුල්‍යවූ; වෙය්‍යාකරණං, විවරණය; සම්මා ලද්ධො, මනාකොට ලත්සේක්ද; බොධිසම්භාරධම්මෙ, (දානශීලාදී) බොධිසම්භාරධර්‍මයන්; පූරෙත්වා, සර්‍වප්‍රකාරයෙන් පුරා; බොධිමූලෙ, (ක්‍රමයෙන් ගොස්) අශ්වත්ථබොධිමූලයෙහි; ඉති, මෙසේ; තික්ඛිණබලෙ, තීක්ෂණවූ බලඇති; (හෙවත් කල්පසහස්‍රශතාධික චතුරසඞ්ඛ්‍ය අෂ්ටාසඞ්ඛ්‍ය සොළසාසඞ්ඛ්‍යප්‍රමිතකාලයක්මුළුල්ලෙහි නිරතුරු පෙරුම්පුරා විජ්‍රාසනාරූඪවූ මහාත්මානන්විසින්මිස සෙස්සන්විසින් ජයගන්නට බැරිබැවින් ඉතා තීක්ෂණවූ) බලඇති; පංචමාරෙවිජෙත්වා, (යටකියනලද ප්‍රකාරඇති දෙවපුත්‍රමාරාදිවූ) පස්මරුන් ජයගෙණ; බුද්ධො, (අතීතාදි කාලත්‍රයවර්තිවූ සර්‍වධර්‍මයන් සර්‍වප්‍රකාරයෙන් පරෝපදෙශරහිතව) ස්වයම්භූඥානයෙන් දත්සේක්ද; සුර, (ශක්‍රබ්‍රහ්මසුයාමසන්තුසිතාදි) දෙවියන් විසිනුද; නර, (ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි) මනුෂ්‍යයන් විසිනුද; මහිතං, (නමනමන්ගේ යථාශක්තීන්) පුදනලද්දේද; තං ධම්මරාජං, (සුරාසුරනරොරග මෞලිමාලාලඞ්කෘත ශ්‍රීපාදාරවින්දවන්දොපසොභිතවූ) ඒ සද්ධර්‍මචක්‍රවර්තිස්වාමිවූ සර්‍වඥරාජයා; අහං, මම; මුද්ධනානමාමි; භක්තිප්‍රේමාතිභාරාවනතොත්තමාඞ්ගයකරණකොටගෙණ නමස්කාරකරමි.

102. ආදිච්චවංසස්ස, සූර්‍ය්‍යවංශඇත්තාවූ; අතිවිපුලගුණස්ස, ඉතා විපුල ගුණඇත්තාවූ; ඤෙය්‍යත්ථඤ්ඤුණස්ස, ඤෙය්‍යාර්ථදන්නාවූ; ධම්මරඤ්ඤො, ධර්‍මරජුන්වූ; සත්ථුස්ස, ශාස්තෘහුගේ; යං ගුණං, යම්ගුණයක්; මෙ, මා විසින්; ගාථානං, ගාථාවන් සම්බන්ධිවූ; දසදසකමිතා, දශදශප්‍රමිතයකින් (හෙවත් සියයකින්;) වණ්ණිතං, වර්ණනාකරණලද්ද; එතෙන පුඤ්ඤෙන, ඒ කුශලකර්මය හේතුකොටගෙණ; අඝතමං හන්ත්වා, ලෙව්හි පප නමැති අඳුරුනසා; සද්ධම්මදීපො, (සර්‍වඥයන්වහන්සේගේ) සද්ධර්‍මප්‍රදීපය; සුචිරංඨාතු, බොහෝකලක් සිටීවා; රාජා, (අපගේ ශ්‍රීලඞ්කාධිපතිවූ

103. මෙඝා වස්සන්තු කාලෙ තිසරණසරණා සබ්බසත්තා භවන්තු
දුක්ඛා මුත්තා ච නිච්චං පමුදිතහදයා අඤ්ඤමඤ්ඤං අවෙරා,
අස්මාහං පාපුණෙය්‍යං තුසිතපුරවරං ගන්ත්වා තස්මිං වසන්තො
පච්ඡා මෙත්තෙය්‍යනාථං තිභුවනතිලකං දස්සනායග්ගබුද්ධං.

———oo———

---

නරශ්‍රෙෂ්ඨයා ප්‍රධානකොටඇති) රජදරුවෝ; අගති, (ඡන්දාදී) සතරඅගතියට; අගමකා, නොයන්නාහු; ධම්මෙන, දැහැමින්; සාසනමෙව, (ත්‍රිවිධවූ) ශාසනයද; ලොකඤ්ච, ලොකයද; පාලෙන්තු, (ස්වනෙත්‍ර ස්වපුත්‍රාදීන් මෙන් අප්‍රමාදව) පාලනයකෙරෙත්වා.

103. මෙඝා, වර්‍ෂාවෝ; කාලෙ, සත්හට ප්‍රයෝජනවත්කාලයෙහි. වස්සන්තු, (අවෘෂ්ටිඅතිවෘෂ්ටිනොකොට දෙපෝයෙන්දෙපෝය දසදවසින් දසදවස පස්දවසින් පස්දවස මනාකොට) වසිත්වා; සබ්බසත්තා, සියලුසත්ත්වයෝ; තිසරණසරණා, තිසරණයම සරණකොට ඇත්තාහු; දුක්ඛා ච මුත්තා, එහෙයින් දුඃඛයෙන්ද මුක්තවූවාහු; අඤ්ඤමඤ්ඤං අවෙරා, ඔවුනොවුන්කෙරෙහි අවෛර්වූවාහු; නිච්චං, සතතයෙන්; පමුදිතහදයා භවන්තු, ප්‍රමුදිතවූ හෘදයඇතිවෙත්වා; අහං, මමවනාහි; තුසිතපුරවරං, උතුම්වූ තුසිතපුරයට; අස්මා ගන්ත්වා, මේඅත්බැවින් චුතවගොස්; තස්මිං වසන්තො, (මෛත්‍රෙය්‍යබෝසතානන්වහන්සේගේ ධර්මදෙශනාව අසමින්) එහි වසන්නෙම්; පච්ඡා, පසුව අනාගතයෙහි; නාථං, ලොකනාථවූ; තිභුවනතිලකං, භුවනත්‍රයට; තිලකයක්වැනිවූ; අග්ගමෙත්තෙය්‍යබුද්ධං, උතුම්වූ මෛත්‍රෙය සම්‍යක්සම්බුද්ධසර්වඥරාජොත්තමයානන්වහන්සේ; දස්සනාය, දකින්ට; පාපුණෙය්‍යං, පැමිණෙන්නෙමි.

ශු භ ම ස්තු.

---

**නිමි.**

# ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 9 | පාලිනො | පාලිතො |
| ,, | 30 | පාලිනො | පාලිතො |
| ,, | 31 | රක්‍ෂාකරන්නාවූ | රක්‍ෂාකරණලද්‍දාවූ |
| 3 | 3 | ගහෙණ්වා | ගහෙත්වා |
| 4 | 12 | සමදිඬ්ඪගිඛා | සමඪිඬ්ඪගිඛා |
| 5 | 7 | අච්ඡදසසි | අච්ඡදසසිං |
| ,, | 10 | සිඛී | සිඛිං |
| 9 | 11 | ගීතමූසා | ගීතමූගා |
| 11 | 10 | අවනි | අවනිං |
| 13 | 3 | සන්තානවිසෙසකො | සන්තානංචවිසෙසකො |
| 16 | 7 | චලයා | වලයා |
| 21 | 9 | ආචරිය | ආචෙර |
| 24 | 9 | මඤ්ජුනීල | මඤ්ජුනිලා |
| 26 | 12 | ජනක | ඡණක |
| ,, | 34 | ගණ | සැණ |
| 28 | 4 | මුඛං | මුඛා |
| 29 | 9 | පුලිඞ්ග | ඵුලිඞ්ග |
| 30 | 2 | සකඛිභූතං | සක්‍යභූතං |
| ,, | 12 | කිනතුහි | කිනතුණ්හි |
| 32 | 12 | අකාරමාදි | අකාරමාදිං, |



